# ලක්දිව සංස්කෘත සාහිත්‍යයේ ආරම්භය හා විකාසය

මීපිටියේ සීලරතන හිමි

Sanskrit is the oldest language of the world in which civilization and culture took their first breath. It is a fact that this beautiful language flourished on the land which is known as "India that is Bharat" and later on expanded to other regions. Sri Lanka is an ancient geography which is connected with India, culturally and politically as Lanka, since the times of Ramayanam – The earliest ithihasa composed in Sanskrit. Reference of Sri Lanka is also found in literature of other later Indian languages. Being almost connected with the mainland India, footprints of Sanskrit is naturally found in Sri Lanka in form of inscriptions and literature. Historical accounts of Sri Lanka also contain useful information on the same. Sanskrit literature in Sri Lanka has a long history. Sri Lanka has a very long association with Sanskrit in almost every field of civilization and culture.

භාරතය හැරුණුවිට සංස්කෘත සාහිත්‍ය විෂයෙහි දායකත්වය දැක්වූ රටවල් අතුරින් ශ්‍රී ලංකාවට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. මෙරට විසූ ගිහි-පැවිදි පඬිවරුන් තුළ පැවති සංස්කෘත භාෂා පටුත්වය නිසා ඒ ඒ යුගයන් හි විවිධ කාව්‍යාංගවලට අයත් ස්වාධීන නිර්මාණ රැසක් බිහි විය. චීනය, ටිබෙටය, බුරුමය වැනි රටවල සංස්කෘත භාෂා සාහිත්‍යය සංවර්ධනයෙහි ලා දායකත්වය ලැබුණේ භාරතයේ පහළ වූ නිර්මාණවලට භාෂ්‍ය, අටුවා, සන්‍ය ලිවීමෙනි.

ලක්දිව සංස්කෘත භාෂාව භාවිතවීම ආරම්භ වූයේ කවර වකවානුවක ද යන්න අවිනිශ්චිත ය. ථෙරවාද බුදුදහමේ ප්‍රකාශන මාධ්‍යය වූ පාලි භාෂාව මෙරට ව්‍යාප්ත වූ

තරමට හින්දු සමයේ මාධ්‍ය වූ සංස්කෘතය එතරම් ශීඝ්‍ර ව මෙරට ව්‍යාප්ත වූයේ නැත. අශෝක ධම්දූතයන් මෙරටට පැමිණෙන්නට පෙර, එනම්, ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට භාවිත වූ භාෂාව කුමක්ද යන්නට තවම පිළිතුරක් නොමැත.

ප්‍රාග් බෞද්ධ යුගයේ ලක්දිව ව්‍යවහාර වූ භාෂාවක් හෝ භාෂාවන් පිළිබඳ ක්‍රමවත් පර්යේෂණයකට ප්‍රමාණවත් සාධක මෙතෙක් ලැබී නොමැත. එහෙත් ජනශ්‍රුතියේ එන ඓතිහාසික වාර්තා ස්වරූපයේ ග්‍රන්ථවලට ඇතුළත් වූ සිද්ධීන් ආශ්‍රයෙන් ප්‍රාග් බෞද්ධ යුගයේ ලක්දිව සංස්කෘත භාෂාව ව්‍යාප්ත ව පැවති බව හා සංස්කෘත භාෂාව අදහස් හුවමාරු කර ගැනීමේ මාධ්‍යය වශයෙන් පැවති බව ප්‍රකට වෙයි.

මෙරට ලිඛිත ඉතිහාසය ආරම්භ වන්නේ විජයගේ පැමිණීමේ සිට බැවින් ඊට පෙර කාලවකවානු හා සිදුවීම් පිළිබඳ ඉතිහාසය ප්‍රධාන වශයෙන් ජනප්‍රවාද මූලාශ්‍රය කර ගෙන ගොඩනැගුවක් විය. කෙසේ වෙතත්, ආදි කාලීන ලාංකික නරපතියෙකු වශයෙන් සැලකෙන රාවණා රජු පිළිබඳ රාමායණයේ දැක්වෙන කරුණු සපුරා බැහැර කළ හැකි නොවේ. රාමායණයේ එන සිදුවීම් හා ස්ථාන පිළිබඳ විස්තර සම්බන්ධ ජනප්‍රවාද රාශියක් දේශීය වශයෙන් ගොඩ නැගී තිබීම එයට හේතුවකි. රාමායණයේ විස්තර වන ''ලංකා පුරය'' ශ්‍රී ලංකාව වශයෙන් සලකන විට රාමායණය ශ්‍රී ලංකාවේ සංස්කෘත සම්බන්ධව දක්වන තොරතුරු වැදගත් බවක් ගනී. රාමායණයේ එන පහත දැක්වෙන හනුමන්ගේ ප්‍රකාශයෙන් රාවණ රජු සංස්කෘත දැන සිට බව පැහැදිලි වේ. ''මා බ්‍රාහ්මණයෙකු ලෙස සීතාට සංස්කෘත වදන් දුන් විට සීතා තමා රාවණ යයි සිතමින් බියවනු ඇතැ''යි හනුමාන් සිතයි.

යදි වාචාං ප්‍රදාස්‍යාමි - ද්විජාතිරිව සංස්කෘතාම්

රාවණාමන්‍යමානාමාං - සීතා භීතා භවිෂ්‍යති[1]

ලංකාවේ බ්‍රාහ්මණ ගණයට අයත් රාක්ෂසයන් හෙවත් බ්‍රාහ්මණ රාක්ෂසයන් විසූ බව ද, ඔවුන් වෛදික පිළිවෙත් අනුව යමින් සිටි බව රාමායණයෙහි[2] සඳහන් වේ. ශ්‍රී ලංකාවේ සංස්කෘත සම්බන්ධයෙන් රාවණ පුවත වැදගත් වන්නේ ඔහු සංස්කෘත භාෂාව භාවිත කළ අයෙකු බවට, රාමායණයෙන් ලැබෙන සාධක නිසා පමණක් නොවෙයි. ශ්‍රී ලංකාවේ දී සංස්කෘතයෙන් ලියන ලදැයි සැලකෙන ''අකිප්‍රකාශ'' හා ''කුමාරතන්ත්‍ර'' යන වෛද්‍ය ග්‍රන්ථද්වය ද රාවණ රජුගේ කර්තෘත්වයට පැවරෙයි. විජය පැමිණීමට පෙර සිට ම මෙරට සංස්කෘත භාෂාව භාවිතව තිබූ බවට රාවණ පිළිබඳ පුරාවෘත්තය ඉඟිකළ ද මෙහි එන සංස්කෘත යන්න පිළිබඳ නිශ්චිත නිගමනයක් නොමැත. මක්නිසාද විජය මෙරටට පැමිණි ක්‍රිස්තු පූර්ව 6 වන සියවස වන විට සංස්කෘත භාෂාව බිහි වී නොතිබිණි. ක්‍රි.පූ. 4 සියවසේ විසූ පාණිනි විසින් සංස්කෘත භාෂාව නිර්මාණය කරන ලදැයි සැලැකේ.

ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට සංස්කෘත භාෂාව ව්‍යාප්ත ව පැවති බවට ලිඛිත සාධක බොහෝය. මහාවංසාගත ලිඛිත සාධක අනුව ලැබෙන ප්‍රථම සාධකය වන්නේ බ්‍රාහ්මණයක් පිළිබඳ ව දැක්වෙන සඳහන් ය. ලංකාවේ ආදිම රජු වශයෙන් මහාවංසයේ සඳහන් වන්නේ විජය යි. ඔහුගේ පිරිවර අතර, උපතිස්ස නම් බ්‍රාහ්මණයෙකු[3] සිටි

බව සඳහන් වේ. පණ්ඩුකාභය රජුගේ ආචාර්යවරයා පණ්ඩුල නම් බ්‍රාහ්මණයෙකැයි මහාවංසය[4] සඳහන් කරයි. පණ්ඩුලගේ පුත්‍ර චන්ද්‍ර පණ්ඩුකාභයගේ පුරෝහිතයා විය.[5] පණ්ඩුකාභය රජු අනුරපුර නගර නිර්මාණයේ දී වාස්තු විද්‍යාඥයන් විචාළ බව මහාවංසය පවසයි.[6] එකල භාවිත වූ පණ්ඩුවාසුදේව, ගිරිකණ්ඩශිව, චන්ද්‍ර ආදි සංඥා නාමවල පවා හින්දු ආගමික බලපෑමක් පැවති බව පැහැදිලි වේ.[7] එහි ම දෙවන පෑතිස් රජුගේ නියෝජිතයා වශයෙන් අශෝක රජු හමුවීමට ගිය මහා අරිට්ඨ කුමරු, පුරෝහිතයා වශයෙන් බ්‍රාහ්මණයකු කැටුව ගිය බව සඳහන් වේ.[8] ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ දඹකොළ පටුනේ සිට අනුරාධපුරයට වැඩම කරවන විට තිවක්ක නම් බමුණු ගමට සැපත් වූ බව මහාවංසයේ දැක්වේ.[9] බුද්ධකාලීන භාරතයේ පැවති විවිධ ආගමික නිකායයන් ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට ව්‍යාප්ත ව පැවති බවට සාධක ලැබේ. පරිබ්‍රාජක, නිගණ්ඨ, ආජීවක, බ්‍රාහ්මණ, පාෂාණ්ඩ, ශ්‍රමණ, කුම්භාණ්ඩ[10] වැනි ආගමික නිකායයන් ඒ අතර විය. ඉහත සඳහන් සාධක අනුව ප්‍රාග් බෞද්ධ යුගයේ ලංකාවේ බ්‍රාහ්මණයන් විසූ බව පැහැදිලි වේ. ඒ අනුව වෛදික ආගමික සම්ප්‍රදායයන් සංස්කෘත භාෂාවත් ඒ අවධියෙහි මෙහි පැවැතියැයි අනුමාන කිරීම යුක්ති යුක්ත ය.

අනුරපුර යුගයේ ලක්දිව දේශපාලනික, සංස්කෘතික ජීවිත හැඩගැස්වීමෙහි ලා ඉවහල් වූ බලවේග දෙකකි. බමුණු බලවේගය හා ථේරවාද බුදුදහමේ බලවේගය යි.[11] එයින් බමුණු බලවේගයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. බමුණු බලවේගය කලිනුදු කී පරිදි, ප්‍රාග් බෞද්ධ යුගයේ සිටම මෙරට ක්‍රියාත්මක විය. මෙකී බමුණු බලවේගය රාජ්‍ය සභාව කෙරෙහි තදින් බලපෑ සමයක ඔවුන්ගේ බලවේග මූර්තිමත් කළ සාහිත්‍ය ග්‍රන්ථ බිහිවීම ස්වභාවික ය. මේ නිසා මොවුන් අතින් රචනා වූ ග්‍රන්ථ සංස්කෘත භාෂාවෙන් ලියවෙන්නට ඇත.

අශෝක ධර්ම දූතයන් මෙරටට වැඩම කර ධර්ම දේශනා කළ භාෂාව කවරක් වුවද, එය මෙරට විසූ ජනතාවට වැටහෙන භාෂාවක් විය යුතුය. ධර්මදූතයන් ගේ භාෂාව අශෝක ප්‍රාකෘතය නම් එය පාලියට හෝ සංස්කෘතයට ආසන්න වූවක් විය යුතු ය. අශෝක ධර්මදූතයක් වැඩම කළ භාරතයේ එම ප්‍රදේශයේ එවකට භාවිත වූයේ පාලියට වඩා සංස්කෘතයට සමීප ප්‍රාකෘතයකි.[12] මෙබඳු සාධක පිඬු කොට ගැනීමෙන් ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට සංස්කෘත භාෂාවට උසස් තැනක් හිමිව තිබූ බව පැහැදිලි වේ.

ක්‍රි.ව. පළමුවන සියවස අවසානයේ හෝ දෙවන සියවස ආරම්භයේ උතුරු දඹදිව පුරුෂ පුරයෙහි රජ කළ කණිෂ්ක අධිරාජයාගේ සමයේ මහායානිකයන්ගේ ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමේ ප්‍රතිඵල වශයෙන් මහායාන බුදුදහම ලේඛනගත කොට දේශ දේශාන්තරයන්හි ප්‍රචාරයට කටයුතු සලස්වන ලදි. කණිෂ්ක රජු ඒ සඳහා මහත් උද්යෝගයෙන් කටයුතු කළේය. මහායාන බුදුදහම මෙරටට පැමිණීම ආරම්භ වූයේ මෙම අවධියේ ය. එය මෙරට ව්‍යාප්ත වීමත් සමඟම මෙහි සංස්කෘත භාෂාව ව්‍යාප්ත වීමේ ප්‍රවණතාව වැඩි වන්නට විය. වරින් වර මෙරටට මහායානික බෞද්ධ නිකායයන් සංක්‍රමණය වූවා මෙන්ම මෙහි අලුතින් බෞද්ධ නිකායයන් බිහි වන්නට ද විය. මහා විහාරය පිහිටුවීමෙන් වසර දෙසිය දාහතයි මාස දහයයි දින දහයක් ගිය

තැන වළගම්බා රජතුමා ගිරි නම් නිගණ්ඨයා සිටි ස්ථානයේ අභයගිරි නම් විහාරයක් ඉදිකර මහාතිස්ස තෙරුන්ට පූජා කිරීමත් සමඟ ම අභයගිරි නම් මහායානික ආගමික මධ්‍යස්ථානය බිහි විය.[13]

මහාතිස්ස තෙරුන්ගේ ශිෂ්‍ය බහුලමස්සුතිස්ස තෙරුන් පන්සියයක් භික්ෂූන් සමඟ මහා විහාරයෙන් ඉවත්ව ගොස් අභයගිරියේ පදිංචි ව සිය ආචාර්යවරයාගේ පක්ෂය ගෙන කටයුතු කළේය. මේ යුගයේ දඹදිව වජ්ජි පුත්‍රක නිකායේ ධර්මරුචි භික්ෂුවගේ ශිෂ්‍යයෝ පල්ලරාරාම විහාරයෙන් මෙහි අවුත් අභයගිරි භික්ෂූන් සමඟ එකතු වූහ. එතැන් පටන් අභයගිරිවාසී භික්ෂූහු ධර්මරුචි නිකායිකයන් නමින් ප්‍රකට වූහ.[14]

මහා විහාරය පාලි භාෂාමය ශාස්ත්‍රීය කටයුතුවලට සරු බිමක් වූවා සේම අභයගිරිය සංස්කෘත භාෂා ශාස්ත්‍රයට විවෘත බිමක් විය. මහායාන බුදුදහම ලේඛනගත වූයේ සංස්කෘත භාෂාවෙනි. සංස්කෘත භාෂාව පදනම් කර ගත් වජ්‍රයානය, නීලපටදර්ශනය ආදි මහායාන දර්ශන මෙරට ව්‍යාප්ත විය. අභයගිරිවාසී ධර්මරුචිකයන් දක්ෂිණගිරිවාසී සාගලිකයන් පොදුවේ වෛතුල්‍යවාදීන් සේ හැඳින්වෙන අතර, මොවුන් ගුරු කොට ගත් ධර්ම ග්‍රන්ථ වෛතුල්‍ය සූත්‍ර හෙවත් වෛපුල්‍ය සූත්‍ර නමින් හැඳින්වේ.[15] එම ධර්ම, ලේඛනගත වූයේ සංස්කෘත භාෂාවෙනි. මහායානිකයන්ගේ ජාත්‍යන්තර භාෂා මාධ්‍යය වූයේ ද සංස්කෘතිය යි. මහායානය පිළිගත් අභයගිරිය සංස්කෘත භාෂා ශාස්ත්‍රයන් කෙරෙහි ඇදී ගියේ ය.

මහායානය මෙරට ව්‍යාප්ත වීමට හේතු දක්වන මොරටුවේ සාසනරතන හිමි මෙසේ පවසයි. ''මහායානිකයන්ට ලක්දිව කටයුතු කිරීමට පහසු වූයේ ද මහායාන ධර්මය ඉතා ඉක්මනින් ලක්දිව ව්‍යාප්ත වූයේ ද ඔවුන් සංස්කෘත භාෂාව ව්‍යවහාර කළ බැවිනි''.[16] ෆාහියන් නම් චීන දේශාටක භික්ෂුව මෙරට සංචාරය කළ වකවානුවේ අභයගිරිවාසී භික්ෂූන් වහන්සේලා සංස්කෘත භාෂාවෙන් කථා කළ බව දක්වේ.

දිඞ්නාග, නාගාර්ජුන, අසංග, වසුබන්ධු වැනි කුශාග්‍ර බුද්ධිමත් මහායාන බෞද්ධ දාර්ශනිකයන්ගේ කෘතීන් ප්‍රකාශ වූයේ ද සංස්කෘත භාෂාවෙන් බැවින්, ලක්දිව පහළ වූ මහායානිකයන්ට ඒවා හැදෑරීමට සංස්කෘත භාෂාව ප්‍රගුණ කළ යුතු විය. එතෙක් කල් බමුණන්ගේ ඒකාධිකාරයක් ව පැවති සංස්කෘතය, අභයගිරි විහාරය මහායාන දහම පිළිගැනීම සමඟම වඩා ජනප්‍රිය විය. ලෞකික විද්‍යාශාස්ත්‍ර විෂයයෙහි මෙන්ම සංස්කෘතය හැම අතින් පරිපෝෂිත භාෂාවක් විය. ශාස්ත්‍රඥානය ලැබීමේ දී සංස්කෘත භාෂා ඥානය එක් මාර්ගයක් විය. මේ නිසා මහායානික භික්ෂූන් අතර, සීඝ්‍රයෙන් සංස්කෘත භාෂාව ව්‍යාප්ත විය.

අනුරපුර යුගයේ ආරම්භයේ සිට අවසානය දක්වා මෙරටට සංස්කෘත භාෂා අධ්‍යයනය ඉතා ඉහළ මට්ටමක පැවති බව ඉහතින් දක්වන ලද සාධකවලින් හෙළි වේ. මේ නිසා ම භාරතයේ රචිත විශිෂ්ට සංස්කෘත නිර්මාණ බොහොමයක් මෙරට පාඨක ජනතාව අතර ජනප්‍රිය ව පැවති බව ඒ සාධක අනුව නිගමනය කළ හැකි ය.

මහානාම රජ දවස (ක්‍රි.ව. 406 - 428) හෙළ අටුවා පාලියට පරිවර්තනය කිරීමේ

කාර්යය සඳහා වැඩම කළ අටුවා ඇදුරු බුදුගොස් හිමි සිය අටුවාවල ඉදිරිපත් කරන විවිධ සාධකවලින් අනුරාධපුර යුගයේ මෙරට භාරතයේ රචිත වීරකාව්‍ය ඉතා ජනප්‍රිය ව පැවති බව සනාථ වේ. දීඝනිකායේ සම්මාදිට්ඨි සූත්‍රයට අර්ථ සපයන උන් වහන්සේ ''සම්ඵප්පලාප'' යන්න මෙසේ විස්තර කරති. ''අනත්ථවිඤ්ඤාපනකායවචීපයෝග සමුට්ඨාපිකා අකුසලචේතනා සම්ඵප්පලාපො සො ආසෙවති මන්‍දතාය අප්පසාවජ්ජො, ආසේවන මහන්තතාය මහා සාවජ්ජො තස්ස ද්වෙ සම්භාරා, භරත යුද්ධ සීතාහරණාදී නිරත්ථක කථා පුරෙකඛරතා, තථාරූපී කථාකතනඤ්ච''[17]

මෙයින් අපට වැදගත් වන්නේ තස්ස ද්වේ සම්භාරා ආදි කොටස යි. එහි අදහස මෙසේ ය.'' එය (සම්ප්‍රප්පලාපය) කොටස් දෙකකින් යුක්ත වේ. එනම්, (1) භාරත යුද්ධ සීතාහරණාදී නිරර්ථක කථාවන්ට කන්දීම (2) එවැනි කථා කීම යනුවෙනි. මෙහි භාරතයුද්ධ යන්නෙන් මහාභාරතය ද, සීතාහරණ යන්නෙන් රාමායණය ද ගැනේ. භාරතයේ විශිෂ්ටතම වීර කාව්‍යද්වය ලංකාවේ ජනප්‍රිය ව තිබෙන්නට ඇති බව මෙයින් මනා ව පැහැදිලි වේ. බුදුගොස් හිමියන්ගේ මේ ප්‍රකාශයෙන් හැඟී යන්නේ මහාභාරතය, රාමායණය පමණක් නොව, ජනප්‍රිය ව පැවැති එවැනි අනෙක් සංස්කෘත ග්‍රන්ථ ද සම්පප්ප්‍රලාප ගණයෙහි ලා ඉවත ලන්නට මහා විහාරිකයන් ගත් උත්සාහයේ ඡායාමාත්‍රයකි.

ක්‍රි.ව. 8 - 10 සියවස්වල රචිත සීගිරි ගීවලින් සංස්කෘතය මෙරට ව්‍යාප්ත ව තිබූ තරම ප්‍රකට වේ. එහි රචිත ගී සිය ගණනක ආරම්භයේ ආශීර්වාදය පිණිස යොදා ගෙන ඇත්තේ සංස්කෘතයේ එන ''ස්වස්ති'' යන්න යි.[18] මෙම ගීවල කීර්තිවර්මන් හා ශ්‍රී හර්ෂ වැනි සංස්කෘත නාම හමු වේ. වජ්‍රවර්මන් නැමැත්තකු විසින් කැටපත් පවුරේ රචනා කරන ලද සංස්කෘත ශ්ලෝකයක් හමු වේ.

පීනපයෝධරභාරා - ලලිතසාරසරවීත තනුමධ්‍යා
නීලේද්දීවරනයනා - කෙයං මනෝරමා රාමා[19]

මේඝදූතය වැනි සංස්කෘත දූත කාව්‍යවල ආභාසය සීගිරි ගී රචනයේ දී ලැබුණු බව

වන්දිම් හිමි වලා - තොගොසින් ඇය නිවෙස්නට
පිරිබුන් පගා මලසුන - දිවො තො හදහව කිය කියයි.[20]

වැනි පද්‍යවලින් ස්ඵුට වේ. මේ පද්‍යය ලියන යුගයේ සංස්කෘතයේ ප්‍රභව හොඳින්ම පැවැති බව පරණවිතාන පෙන්වා දෙයි.

සංස්කෘත සාහිත්‍ය මෙරට වඩාත් ව්‍යාප්තව තිබූ බවට තවත් ප්‍රබල සාධකයක් වෙයි. එනම්, ''(ක්‍රි.ව 833 - 853) ශිලාමේඝසේනයන් විසින් ලියූ සියබස්ලකර යි. සංස්කෘත සාහිත්‍යයේ බලපෑම කාව්‍යාලංකාර විෂය යටතේ පවා සිංහල කවීන්ට ප්‍රිය වූ ආකාරය දණ්ඩින්ගේ කාව්‍යදර්ශය, සියබස්ලකර නමින් සිංහලයට පරිවර්තනය වීමෙන්ම පෙනේ. සියබස්ලකර, දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශයේ සිංහල ඡායානුවාදයකි. මේ කෘතියට පෙරාතුව කාව්‍යාලංකාර කෘති ලංකාවේ පැවති බවට සියබස්ලකරේම

කරුණු සඳහන් වේ. සංස්කෘතයෙහි පරිචයක් නොමැත්තවුන්ට ද කාව්‍යාලංකාර පිළිබඳ මුලින් ලියැවුණු කෘති නොදත්තවුන්ට ද තමන්ගේ කෘතිය ප්‍රයෝජනවත් වේ යැයි සියබස්ලකර කතුවරයා පවසයි.

''දෙරැස්වස් කියමි - පෙරගත් සැකෙවිනිදු වූ

නොදත නොදත දෙව් බස් - කවි ලකුණිනෙක් දෙස්[21]

මෙහි කවි ලකුණු නමින් හැඳින්වෙන්නේ කාව්‍යාදර්ශය ම යි. කාව්‍යාදර්ශ කෘතියේ සංඥා නාමය කාව්‍යලක්ෂණ යන නමිනුදු දක්වේ.[22] දැනට ශේෂව පවත්නා අනුරාධපුර යුගයට අයත් පැරණි සිංහල සාහිත්‍ය කෘති නිර්මාණය කිරීමෙහි ලා පාලි භාෂාවේ ආභාසය මෙන් ම සංස්කෘත සාහිත්‍යය ද බලපා ඇති බව නොයෙක් නිදසුන්වලින් දැන ගත හැකි ය.

පස්වන කාශ්‍යප රජුගේ (ක්‍රි.ව 913 - 923) ධම්පියා අටුවා ගැටපදය කෙරෙහි සංස්කෘතයේ බලපෑම් ලැබී ඇත. කතුවරයා බහුලව සංස්කෘත පද භාවිත කර ඇත. ''මෙයින් ධර්ම රත්නයෙහි බුද්ධභාව හේතුත්ව ලක්ෂණ ගුණ දක්වා ප්‍රමාණාරහසේ කියූ වෙත්''[23] භාග්‍යාග්නි කරණකොට ශරීරගත තේජෝ ධාතු දවමින් නැසෙන සේ කියූ වෙත්.''[24]

ව්‍යාකරණ නීතිරීති පැහැදිලි කිරීමේදී සංස්කෘත ක්‍රමය අනුගමනය කර තිබෙන අයුරු පහත දක්වෙන පාඨවලින් පැහැදිලි වේ.

''භා දීප්තෞ''[25]

ග්ලෛ හර්ෂකර්ෂේ[26]

''අතිචරිත්වා - අති පූර්ව චරිති සෙවනර්ථම්හි''[27]

මේ හැම කරුණකින්ම පැහැදිලි වන්නේ ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් අනුරාධපුර යුගයේ සංස්කෘත භාෂා භාවිතය පැවති බව යි. ආර්‍යාගමනයෙන් පසු ව සංස්කෘත භාෂාවේ වර්ධනයක් ඇති වූ අතර, මහායාන බුදුදහමේ ආගමනයත් සමග සංස්කෘත සාහිත්‍යය කෘති බිහි කිරීමේ ප්‍රවණතාව වැඩි වන්නට විය. එසේ නම් ඒ ඒ යුගයන්හි විසූ ගිහි-පැවිදි උගතුන් විසින් සංස්කෘත භාෂාවෙන් නව නිර්මාණ කරන්නට ඇත. එහෙත් අනුරාධපුර යුගයේ ලියැවුණු, දැනට ශේෂ ව ඇති ග්‍රන්ථවලට වඩා විශාල කෘති සංඛ්‍යාවක් එවක පැවති බව දැනට හමු වී ඇති ශිලාලේඛන, අභිලේඛන හා වෙනත් සාහිත්‍ය කෘතිවලින් හෙළි වේ.

මිහින්තලයේ ඉඳිකටු සෑයෙන් සොයා ගන්නා ලද තඹ තහඩුවලින්[28] හා විජයාරාම භූමියෙන් සොයා ගත් තඹ තහඩුවලින්[29] ඉහත ප්‍රකාශය සනාථ වේ. මිහින්තලයේ හා ඒ අවට ප්‍රදේශය මහායානිකයන් සතුව පැවති බව මිහින්තලය ත්‍රිකායස්ථව සෙල් ලිපියෙන් අනාවරණය වේ.[30] එකල ලක්දිව විසූ බෞද්ධයන් අතර සංස්කෘත ග්‍රන්ථ ජනප්‍රියව පැවති බවත්, ඔවුන් ඒවා පූජනීයත්වයෙන් පිදූ බවත්, ඉඳිකටු සෑයට හා විජයාරාමයට අයත් තඹතහඩුවලින් හෙළි වේ. එකී සංස්කෘත ධර්ම ග්‍රන්ථවලින්

උපුටාගත් කොටස් ධර්ම ධාතු වශයෙන් පුදන ලද බව ද ඔප්පු වේ. ඉදිකටු සෑයෙන් සොයා ගත් තඹ තහඩු බොහෝමයක මහායාන පඤ්චවිංශතිසාහශ්‍රිකාප්‍රඥාපාරමිතා ග්‍රන්ථයේ මුල් පරිච්ඡේදයෙන් උපුටාගත් කොටස් ඇතුළත් වේ.[31] තවත් තඹ තහඩු 15 ක ''කාශ්‍යප පරිවර්ත'' නම් ග්‍රන්ථයෙන් උපුටා ගත් පාඨ ඇත.[32] මහායානිකයන් ප්‍රාමාණිකත්වයෙන් සැලකූ මහායාන ධර්මග්‍රන්ථ රැසක් මෙරට උගතුන් අතර ජනප්‍රියව පැවති බව මෙයින් පළවේ.

එකල ලක්දිව උගතුන් අතර, තාන්ත්‍රික හා මහායාන ග්‍රන්ථ රැසක්ම පැවති බව 14 වන සියවසේ විසූ, නිකාය සංග්‍රහය ලියූ දේවරක්ෂිතජයබාහු ස්ථවිරයන් වහන්සේ දැන සිටි බව පෙනේ. නිකාය සංග්‍රහයේ සංස්කෘත ග්‍රන්ථ බොහෝමයක නම් සඳහන් වී තිබේ. ''වර්ණ පිටකය, මායාජාලතන්ත්‍රය, හේරුකාද්බුදය, තත්ත්වසංග්‍රහ, අංගුලිමාලපිටකය, සමාජතන්ත්‍රය, රටඨපාලගර්ජිතය, මහාසමයතත්ත්ව, වජ්‍රග න්ධාරකල්ප, රත්නකූට මරිචිගුහ්‍යකල්ප'' ආදිය වේ.[33] ලක්දිව ප්‍රචලිත වූ මේ සංස්කෘත ග්‍රන්ථ අතුරින් සමහරක් මෙරට උගතුන් විසින් ලියන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

අභයගිරිය ප්‍රමුඛකොට මහායාන මධ්‍යස්ථාන මඟින් මහායාන බුදුදහම පදනම් කරගෙන සංස්කෘත භාෂාවෙන් පොත්පත් රැසක් රචනා වූ බවට සාධක ඇතත්, දැනට ශේෂව ඇත්තේ සංස්කෘත ශිලාලේඛන කීපයක් හා ග්‍රන්ථ අතළොස්සකි. මහා විහාරයට හිතපක්ෂ රාජ්‍ය පාලකයන් අභය ගිරිය ඇතුළු මහායාන ආයතන සමග ගැටුම් ඇති වූ විට එම ආයතන හා ඒවා සතුව තිබූ පොත්පත් දහස් ගණනක් විනාශකර දමන ලදි. එසේ මහා විහාර සම්ප්‍රදායට විරුද්ධව අදහස් අන්තර්ගත ග්‍රන්ථ යයි සලකා අභයගිරිය ඇතුළු ආයතනවලට අයත් ග්‍රන්ථ විනාශ කළ අවස්ථා හතරක් ඉතිහාස ගත වී ඇත.

1. වෝහාරික තිස්ස රාජ සමය[34]
2. ගෝඨාභය රාජ සමය[35]
3. අඹහෙරණ සලමෙවන් රාජ සමය[36]
4. මහසෙන් රාජ සමය[37]

මෙම අවස්ථාවන්හි දී ශ්‍රී ලාංකික සංස්කෘත සාහිත්‍යයට සිදු වූ විනාශය සුළුපටු නොවේ.

ඉහත කී ආකාරයේ දුර්දශාපන්න අවස්ථාවකට මුහුණ පෑ ආයතනයක් තම ග්‍රන්ථ ආරක්ෂා කර ගැනීමට ඒවා විදේශගත කරන්නට ඇත. එසේම දේශ ගවේෂකයන් වශයෙන් මෙරටට පැමිණි ශාස්ත්‍රාභිලාෂීන් විසින් තම දේශවලට මෙරටින් ග්‍රන්ථ ගෙන යනු ලැබීම් ද සිදුවන්නට ඇත. ඉන්දියාව ඇතුළු පෙරදිග වෙනත් රටවලින් හමු වී ඇති බෞද්ධ සංස්කෘතයට අයත් ඇතැම් ග්‍රන්ථවල කරුණු හා කතුවරුන් පිළිබඳව ඇති අවිනිශ්චිතාව ආදිය ඒවා ශ්‍රී ලංකාවේ ලියැවී යැයි සිතීමට පොළොඹවනසුලුය.

ශේෂ වී ඇති, සාහිත්‍ය කෘතිවලට අමතරව අනුරාධපුර යුගයේ ලියැවුණු

මහායාන ආගමික ස්වරූපයක් දරන ශිලාලේඛන හා අභිලේඛන කීපයක් දක්නට ලැබේ. අනුරාධපුර යුගයේ අග භාගයේදී මහායාන බලපෑමට ලක් වූ විහාර මඟින් සෙල් ලිපි ලිවීම සඳහා සංස්කෘත භාෂාව උපයෝගී කර ගෙන ඇති බව පෙනේ. ත්‍රිකාය නමස්කාර ශ්ලෝක වැනි පාඨ සංස්කෘතයෙන් ලිවීම ආගමික හේතු මත සිදු වේ. පාලි, සංස්කෘත නොදන්නා අය පවා වන්දනාමානාදිය සඳහා ගාථා හෝ ශ්ලෝක භාවිත කිරීම සාමාන්‍ය දෙයකි. එහෙත් විහාර පරිපාලනය හා සම්බන්ධ අණපනත් සංස්කෘතයෙන් ලිවීම ඊට වඩා වෙනස් මුහුණුවරක් ගන්නකි. පරිපාලනයට සම්බන්ධ බහුතරයක් දෙනා එම භාෂාව වටහා ගත් නිසා එසේ ලියන්නට ඇතැයි සිතිය හැකි ය.

ලංකාව ආශ්‍රිත රටවල් රැසක ආගමික හා පරිපාලන භාෂාව සංස්කෘත වූ බැවින් ලංකාවේ මහායාන බලපෑම් ලත් කතුවරුන් ශිලා ලිපි ලිවීමේදී සංස්කෘතය භාවිත කර ඇත. සංස්කෘතය හුදු ආගමික භාෂාවක් පමණක් නොවේ. පරිපාලනය සම්බන්ධ වූ නිසා ම පරිපාලන කටයුතු සම්බන්ධ ලිපි ලේඛන සංස්කෘතයෙන් ලියවෙන්නට ඇත.

අනුරාධපුර යුගයට අයත් පැරණි සංස්කෘත ශිලා ලිපිය ලෙස සැලකෙන්නේ කුච්චිවේලි ලිපිය යි.[38] ත්‍රිකුණාමලයට සැතපුම් 21ක් උතුරින් නැගෙනහිර කඩ්ඩිකුලම් කොට්ඨාශයේ පිහිටි ධීවර ගම්මානයක් වන කුච්චිවේලියේ මුහුදු වෙරළේ පිහිටි ගල් පරයක මෙය පිහිටා ඇත. ක්‍රි.ව 5 - 8 සියවස්වලට අයත් බව පරණවිතාන මතයයි. ගලෙහි ස්තූප කොටවන ලද පිනින් බුදු බව ප්‍රාර්ථනා කිරීම මෙහි පරමාර්ථය යි.[39]

අනුරපුර යුගයට අයත් දෙවැනි සංස්කෘත සෙල්ලිපිය තිරියාය නැමති ස්ථානයෙන් සොයා ගන්නා ලදි. තිරිකුණාමලයට සැතපුම් 29ක් උතුරින් පිහිටි තිරියාය හෙවත් කන්දසාමිමලෙයි නම් ප්‍රදේශයේ වටදාගෙය සහ නටබුන් සහිත සිද්ධස්ථානයේ විශාල ගල් පර්තයක මෙම ලිපිය පිහිටුවා ඇත. මෙය ක්‍රි.ව 8 - 9 සියවස්වලට අයත් වූවකි. කර්තෘ අවිඥාත වූ මෙහි එම ස්ථානයේ පිහිටි චෛත්‍ය ගිරිකණ්ඩ නමින් හඳුන්වා ඇත. එම චෛත්‍යය බුදුරදුන්ගේ කේශධාතු නිදන් කොට ත්‍රපුසසක - වල්ලික යන වෙළෙඳුන් විසින් කරණ ලදැයි එහි සඳහන් වේ.[40]

තෙවැනි සෙල්ලිපිය මිහින්තලෙන් හමු වූවකි. මෙම ලිපියේ ද කර්තෘ අවිඥාත ය. ලිපිය අවසානයේ ''භික්ෂුභීර් බෝධිසත්වගුණාකර'' යන්න පමණක් සඳහන් වේ. මෙය අම්බස්ථලය සෙල් චෛත්‍ය අසල ගලක කොටා ඇත. ත්‍රිකායස්තව ලිපිය නමින් හැඳින්වෙන මෙහි බුදුරදුන්ගේ ත්‍රිකාය නමස්කාර කිරීම පිණිස රචිත ශ්ලෝකයන්ගෙන් යුක්ත වේ.

අභයගිරි චෛත්‍යය අසලින් හමු වී ඇති තවත් වැදගත් සෙල් ලිපියක් වේ. එය කලින් ජේතවනාරාම සෙල්ලිපිය ලෙස හඳුන්වනු ලැබූ ලිපිය යි.[41] අභයගිරිය නම් වූ ප්‍රධාන මහායාන ආගමික මූලස්ථාන භූමියෙන් හමු වී ඇති බැවින් එහි මහායාන විහාරයක පරිපාලනමය තොරතුරු අන්තර්ගතය යි සැලකිය හැකි ය.

මෙයට අමතරව මිහින්තලයේ ඉදිකටු සෑයෙන් සොයා ගන්නා ලද තඹ තහඩු

කීපයක කොටන ලද සංස්කෘත සෙල් ලිපියක් වේ. මෙහි අන්තර්ගතය මහායාන ග්‍රන්ථයක කොටස් යයි පරණවිතාන අනුමාන කරයි.[42] සංස්කෘත නාගරී අකුරින් ලියවුණු තවත් ලිපියක් මිහින්තලයේ රාජගිරි කන්දේ ලෙනක තිබී හමු වී ඇත. එසේ ම අනුරාධපුර යුගයට අයත්වන සංස්කෘත සෙල්ලිපි අතර, කපාරාරාම පුවරු ලිපිය[43], ආනඋළුන්දාව පුවරු ලිපිය[44], තිරියාය ගිරි ලිපිය[45], අභයගිරියේ තඹ සන්නස[46] ආදිය වේ.

දහනවවන සියවසේ මුල විසූ කීර්තිමත් භාරතීය කාව්‍ය විචාරකයකු හා නාට්‍ය රචකයකු වූද, රාජශේඛර කවියා අනුරපුර යුගයේ සිංහල කවීන්ගේ නිර්මාණ පිළිබඳ මෙසේ පවසයි.

ජනශ්ච වාක්සුධාසූතීර් මණිසූතිශ්ච රෝහණඃ

නානාත්‍ර සිංහල ද්වීපාන් මුක්තා සූතිශ්චසාගරඃ[47]

අනුරපුර යුගයේ සිංහල ද්වීපවාසීන්ගේ සාහිත්‍ය කෘති ලොව අන් සැමට වඩා අමෘතරස වැහෙන වචනවලින් යුතුයැයි රාජශේඛරයන් කරන මෙම ප්‍රශස්තිය අනුරපුර යුගයේ විසූ අපේ කවීන්ගේ නිර්මාණවලින් තහවුරු වේ. තත්කාලීන ජාත්‍යන්තර භාෂා මාධ්‍යයක් වූ සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා කොට විශේෂ කීර්තියක් ගෙන දුන් අනුරපුර යුගයට අයත් මහා ලේඛකයන් කීප දෙනෙකු ගැන විමල විජයසූරිය[48] සිය අවධානය යොමු කරයි.

1. ආර්යදේව (චතුශ්ශතක, චිත්තවිශුද්ධිප්‍රකරණ)
2. සිංහල රත්න ශ්‍රී ඥාන (කාව්‍ය ලක්‍ෂණ)
3. මහානාම ස්ථවිර (බුද්ධගයා සෙල්ලිපි ශ්ලෝක)
4. මාන යුවරජ පුත් සිංහල කුමාරදාස (ජනාකීහරණය, ශ්‍රී සනානන්ද කාව්‍යය)
5. හීෂගිශ්වර සිංහලාධීශ්වර බුද්ධදාස (වෛද්‍යසාරාර්ථ සංග්‍රහ)
6. අනුපරාධපුර කවි ධීරනාග/භදන්ත ධීරනාදපාද (කුන්දමාලා, සුභාෂිතාවලී)
7. ආයර්‍ය ශූරපාද

මොවුන් අතුරෙන් ඇතමෙකු සිංහල දේශයේ ඉපදී සිංහල දේශයේ නිර්මාණ කාර්යයන්හි නියුතු වූ අතර, ඇතමෙක් විදේශ රටවලදී නිර්මාණවල නිරත වූ බව ඒ මහතා තවදුරටත් ප්‍රකාශ කරයි.

අනුරාධපුර යුගයට අයත්, දැනට ශේෂ වී ඇති මහා කාව්‍යය ජානකීහරණය යි. රාමායණ කථා වස්තුව මූල බීජ කරගෙන එය රචනා කොට ඇත. මෙය එක් කලෙක අභාවයට ගිය කෘතියක් සේ සලකනු ලැබීය. පුරාණ පදගත සන්නයක් උපයෝගී කොටගෙන සර්ග දාහතරකින් සමන්විත මුල් කොටස රත්මලානේ ධර්මාරාම හිමියන් විසින් සංස්කරණය කරන ලදි.[49] පසුව සර්ග විස්සක් වන සම්පූර්ණ කාව්‍යය ඉන්දියාවෙන් සොයා ගෙන ඇත.[50]

පියවර නම් ශාස්ත්‍රී කෘතියේ පරණවිතානයන්ගේ වදන්වලින් මේ කෘතියේ

කතුවරයා කවරෙක් ද යන්න සඳහන් වේ. ''චූලවංශයේ කුමාරධාතුසේන නමිනුත්, ශිලා ලිපිවල මහකුමරතස, කුමරධීර සිරිසඟබෝධි යන කව්වලිනුත් හැඳින්වෙන කුමාරදාස රජු ජානකීහරණය නම් මේ මහකව බැන්ද බවත්...... සවන පැරකුම්බා සමයේ රචිත පැරකුම්බා සිරිතේ කියලා තියෙනවා''[51]

පූජාවලියේ (ක්‍රි.ව 13 සියවස) කියවෙන්නේ මෙය මුගලන් රජ පුත් කුමාරදාස රජු විසින් කරන ලද බවයි. ජානකීහරණ මදුරාසි පිටපතේ ''ඉති ශ්‍රී සිංහලස්‍ය කුමාරදාසස්‍ය කෘතෙ ජානකීහරණ මහා කාව්‍යෙ විංශතිඃ සර්ගඃ සමාප්තමගමත්''[52] යනුවෙනි. ධර්මාරාම සංස්කරණයේ එන්නේ මීට වඩා වෙනස් පාඨයකි. ''කුමාරදාසස්‍ය කෘතෞ ජානකීහරණයේ මහාකාව්‍යෞ රාමාභිෂේක නාම පඤ්චදශඃ සර්ගඃ''[53] මේ සාක්ෂි අනුව ජානකීහරණ කවියාගේ නම කුමාරදාස යැයි ගැනීම උචිත ය. කතුවරයාගේ ජීවන කාලය ගැන විවිධ මත පළ කරන අතර, දෙහිගස්පේ පඤ්ඤාසාර හිමියෝ ක්‍රි.ව 515 දී රාජ්‍යයට පත් කුමාරදාස යන අපරනාමයෙන් හඳුන්වනු ලැබූ කුමාරධාතුසේන රජු යයි හඳුනා ගනිති.[54] එහෙත් ජානකීහරණයේ කර්තෘ කවරෙක් ද යන්න දැන් ස්ථිර ව ම නිගමනය කරනු ලැබ ඇත. ජානකීහරණය අවසානයේ එන කවිවංශ වර්ණනාවට අනුව පරණවිතාන මේ අදහස ඉදිරිපත් කරයි. කුමාරදාස ගේ පියා මානිත නම්. iii වන අග්‍රබෝධි ඔහුගේ ඥාති සොහොයුරෙකි. ක්‍රි.ව. 633 - 643 අතර රජ කළ අග්‍රබෝධිගේ යුවරජු වූයේ මානිත ය. කුමාරදාස, ඔහුගේ පුත්‍රයා යි. දෙවන කාශ්‍යප රජ මානවම්මගේ පිය රජුයි. මානවම්ම ක්‍රි.ව 684 - 718 අතර රජ කළේය. කුමාරදාස මානවම්මගේ ඥාති සොහොයුරෙකි. මේ තොරතුරු අනුව ජානකීහරණ කතුවරයා වූ කුමාරදාස ක්‍රි.ව 7 සියවස අග හෝ සියවස මුල ජීවත් විය.[55]

සංස්කෘත ආදි ජාත්‍යන්තර භාෂා මාධ්‍යයෙන් සාහිත්‍යය, වෛද්‍ය, චිත්‍රකර්ම, වාස්තුවිද්‍යා ආදි විෂයයන් පිළිබඳ කෘති නිර්මාණ කළෝ සිංහල භික්ෂූන් පමණක් නොව ගෘහස්ථ හෙළ පඬිවරු ද වෙති. වෛද්‍ය ශාස්ත්‍රයෙහි දේශීය හා භාරතීය දෙඅංශයෙහි ම ප්‍රමාණික සිංහල රාජර්ෂිවරයකු සේ සම්මානික බුද්ධදාස රජතුමා (ක්‍රි.ව 337 - 365) ඉන් එක් අයෙකි. ඔහු ලියූ සාරාර්ථසංග්‍රහය[56] ඔහු පෑ එම දක්ෂතාව ප්‍රකට කරන කැඩපතකි. ගයිගර්, ටර්නර් ආදි යුරෝපීය උගතුන් ගේ අවධානයට මෙම කෘතිය ලක්වී නොමැති අතර, අනුරපුර සාහිත්‍යය ගැන ලියූ සාහිත්‍ය විචාරකයන් වැඩි දෙනා එය නොසලකා හැර එහි කර්තෘත්වය ද සැකයට භාජනය කර ඇත. ලංකා විශ්ව විද්‍යාලයයේ ලංකා ඉතිහාස ප්‍රථම භාගයේ ප්‍රථම කාණ්ඩයේ දී ලංකාවේ සංස්කෘත සාහිත්‍ය ගැන ලියූ පරණවිතාන මෙය අමතක කළ බව පෙනේ. සිංහල සාහිත්‍ය වංශය කළ පුඤ්චිබණ්ඩාර සන්නස්ගල ''බුද්ධදාස රජතුමාගේ මේ සාරාර්ථ සංග්‍රහය දඹදිව ආයුර්වේද පොත්පත්වලදීත්, වෛද්‍ය ක්‍රමයනුත් ගැබ්කර කරන ලද්දකි. කොටස් තුනකින් යුක්ත සාරාර්ථසංග්‍රහය නම් පොතක් 1903 දී මුද්‍රණයෙන් ප්‍රකාශයට පැමිණ තිබේ. මේ පොත බුද්ධදාස රජතුමා සාරාර්ථසංග්‍රහය හැටියට දක්වා තිබේ. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් ද ඒ අදහස බව පෙනේ.[57] මහාවංසයේ නම් සඳහන් වන බුද්ධදාස රජතුමා කළ පොත් මුද්‍රණයෙන් මේ වෛද්‍ය ග්‍රන්ථය ද යනු සැක සහිත ය.''[58] මේ කෘතියේ උපසංහාර නම් කර්තෘ විඥප්ති ශ්ලෝකවල බුද්ධදාස රජතුමා තමා ගැන මෙසේ පවසයි. ''ත්‍රී සිංහලයෙහි මුල් බැසගත් මෙම ආර්ය රාජ්‍ය

වංශයෙන් පැවත ආ ශ්‍රී සංඝබෝධි ආදි නරේන්ද්‍රයන්ගේ පෙළපතෙහි සිටි බුද්ධදාස රජ තෙමේ මේ ග්‍රන්ථය සැකසීය.''[59] දෙහිගස්පේ පඤ්ඤාසාර හිමි මෙම ග්‍රන්ථය එම රජුගේ ම බව පවසයි. බුද්ධදාස රජතුමා ක්‍රි.ව 388 - 397 තුළ රාජ්‍ය කළේය. සාරාර්ථ සංග්‍රහය වූ කලී අධ්‍යාය හතලිස් අටකින් යුත් ශ්ලෝක දෙදහසියයක් පමණ ඇති විශාල කෘතියකි. මෙම කෘතිය මෑතක දී වෛද්‍යාචාර්ය ආරියදාස කුමාරසිංහයන් විසින් යළි සංස්කරණය කොට සිංහල පරිවර්තනය කර ඇත. එම සංස්කරණයේ අධ්‍යාය පනස් දෙකක් අන්තර්ගත ය.

අනුරපුර මුල් යුගයේ ලියැවුණු වාස්තු විද්‍යා ග්‍රන්ථ ද හමු වේ. ඒ අතර, ශ්‍රී ලංකාවේ මෙතෙක් හමු වී ඇති පුරාණ වාස්තු විද්‍යා ශාස්ත්‍රය පිළිබඳ සංස්කෘතයෙන් ලියැවුණු එකම ශිල්ප ග්‍රන්ථය වන මංජුශ්‍රී භාෂිතවාස්තුවිද්‍යාශාස්ත්‍රය වැදගත් වේ.

මහායානික සම්ප්‍රදායට අයත්, මංජුශ්‍රීභාෂිතවාස්තුවිද්‍යාශාස්ත්‍ර කෘතියේ කර්තෘත්වය මංජුශ්‍රී බෝධිසත්ත්වයන්ට පවරා ඇත. මේ කෘතිය පිළිබඳව ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසය කෘතියේ පරණවිතාන හෝ සංස්කෘත සාහිත්‍යය ග්‍රන්ථය ලියූ දෙහිගස්පේ පඤ්ඤාසාර හිමිගේ අවධානයට යොමු වී නොමැත. මෙකී ග්‍රන්ථ සම්පාදනය වන විට මෙම කෘතිය පිළිබඳ ඔහු නොදැන සිටියා වන්නට ඇත.

මෙම කෘතියේ දැනට හමු වී ඇති එකම සිංහල අත්පිටපත වෝල්ටර් මාරසිංහ විසින් සංස්කරණය කරන ලදුව, ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර ඇත. දැනට එම සම්පූර්ණ කෘතිය සිංහලයට පරිවර්තනය කොට ඇත. චිත්‍රකර්මශාස්ත්‍රය පිළිබඳ කොටස ජම්බුගහපිටයේ ධම්මාලෝක හිමියන් විසින් සිංහලයට පරිවර්තනය කොට ඇත. වෝල්ටර් මාරසිංහ, වාස්තුවිද්‍යාශාස්ත්‍රය ශ්‍රී ලාංකික ප්‍රභවයක් සහිත කෘතියක් බව සනාථ කිරීම සඳහා සනිදර්ශනව කරුණු ඉදිරිපත් කර තිබේ.[60]

මෙය, පැරණි බෞද්ධ ආරාමික වාස්තු විද්‍යාව හා ප්‍රතිමා ශිල්පය විෂය කොට මෙම ග්‍රන්ථය රචනා වී ඇත. මෙම විෂයයන් දෙක පිළිබඳව ලියවුණු ශිල්ප ශාස්ත්‍ර කෘති අතර මෙයට විශිෂ්ට ස්ථානයක් හිමි වේ. මෙහි ඇති තවත් සුවිශේෂ ලක්ෂණයක් වන්නේ ආරාමික සැලසුම් හා ප්‍රතිමා ශිල්පය යන විෂයයන් දෙක යටතේ කරුණු ඉදිරිපත් කිරීම යි. කෘතියේ මුළු ප්‍රමාණය පරිච්ඡේද දහ අටකි. එයින් මුල් පරිච්ඡේද තුන ඇතුළත් කොටස ආරාම සංවිධානය සඳහා වෙන් වී ඇත. එම කොටස ''වාස්තු විද්‍යාශාස්ත්‍ර'' යනුවෙන් නම් කර ඇත. ඉතිරි පරිච්ඡේද පහළොවට අයත් කොටස ''චිත්‍රකර්මශාස්ත්‍ර'' නමි.

''නමඃ සර්වඥාය'' යන්නෙන් ඇරඹෙන කෘතියේ ආරම්භයේ වාස්තු විද්‍යා ශාස්ත්‍රයේ උපත පිළිබඳව කෙටි විස්තරයක් වේ. බුදුන් වෙතින් උගත් එම ශාස්ත්‍රය මංජුශ්‍රී බෝධිසත්ත්වයන් විසින් ලෝකයාගේ යහපත සඳහා දේශනා කර ඇත. අනතුරුව මුළු කෘතියේ විස්තරවන විෂය ක්ෂේත්‍රය පිළිබඳව සාරාංශයක් ඉදිරිපත් කෙරේ.

පැරණි මහායාන ආරාමික වාස්තුවිද්‍යාව හා ප්‍රතිමාශිල්පය අරඹයා නිර්මාණය වූ මෙහි කාලය පිළිබඳ ව විවිධ උගතුන් විවිධ මත පළ කර ඇත. එහෙත් මේ කෘතිය

පිළිබඳව පුළුල් පර්යේෂණයක යෙදෙන වෝල්ටර් මාරසිංහ මේ කෘතියේ කාලය ගැන මෙසේ පවසයි. ''මේ ග්‍රන්ථය ක්‍රි.ව. 5 වැනි හා 7 වැනි ශතවර්ෂ අතර කාලය තුළ රචිත වූ බවට නිගමනය කිරීම යුක්ති සහගත බව මගේ හැඟීම යි.''[61]

ජාතකමාලාව අනුරපුර යුගයේ රචනා වූ ගද්‍ය පද්‍ය මිශ්‍ර චම්පූ කාව්‍යයකි. මෙය, පාලි ජාතක පාලියේ එන ව්‍යාඝ්‍රි ජාතකය තෙක් ජාතක කථා තිස් හතරක් තෝරා ගෙන සකු බසින් රචිත කෘතියකි. මෙහි කතුවරයා ක්‍රි.ව 4 - 5 සිය වස් අතර විසූ ශූරපාද නමැති ගෘහස්ථ පඬිවරයකු බව පිළිගැනේ. සංස්කෘත බෞද්ධ සාහිත්‍යය හා එහි ඉතිහාසය පිළිබඳ යුරෝපීය හා භාරතීය පඬිවරු ශූරපාද ලාංකිකයකු ලෙස පිළිගැනීමට කැමැත්තක් නොදක්වති. මොහු ශ්‍රී ලංකාවේ උපන් සිංහල මහායාන ගෘහස්ථ පඬිවරයෙකු බව ක්‍රි.ව 14 වන සියවසේ (ගම්පල සමයේ) රචිත දේවරක්ෂිත ජයබාහු ස්ථවීරයන්ගේ නිකාය සංග්‍රහයේ දැක්වේ.[62]

සී.ඊ. ගොඩකුඹුර මහතා ද ජාතකමාලාවේ කතුවරයා ශූරපාද බව දක්වයි. ''ජාතකමාලාව නම් විශිෂ්ට චම්පූ කාව්‍යය කළේ නිකාය සංග්‍රහයේ ද නම සඳහන් වන්නා වූ ශූරපාදයන් විසිනි.''[63] කඹුරුපිටියේ වනරතන නා හිමියෝ[64] ද මේ අදහස අනුමත කරති. ලක්දිව සංස්කෘත සාහිත්‍යය පිළිබඳව ලියූ දෙහිගස්පේ පඤ්ඤාසාර හිමි, ජාතකමාලාව ශ්‍රී ලාංකික කතුවරයෙකුගේ කෘතියක් ලෙස නොපිළිගත් බව එහි ඒ පිළිබඳ සඳහන් නොවීමෙන් පෙනී යයි. ජාතකමාලාව ශ්‍රී ලාංකික කතුවරයකුගේ නිර්මාණයක් බව ඔප්පු කළ හැකි තවත් සාධකයක් වන්නේ පසුකාලීන සිංහල, පාලි ග්‍රන්ථ රචනා කළ කතුවරුන් ජාතකමාලාව වඩා ළඟින් ඇසුරු කොට තිබීම යි. දොළොස්වන සියවසේ ගුරුළුගෝමී ධම්ප්‍රදීපිකාවේ දී ජාතකමාලාවේ 18 වන කුම්භ ජාතකයේ පද්‍ය හයක් ද, පූරාණ රූප සිද්ධි සන්නයේ ජාතකමාලාවේ පද්‍ය තුනක් ද උපුටා දක්වා තිබේ. එසේම ලංකාවේ රචිත හත්ථවනගල්ලවිහාරවංසයේ ජාතකමාලාවේ එන පද්‍ය විස්සක් පමණ පාලියට පෙරළා ඇතුළත් කර ඇත.

අනුරාධපුර යුගයේ දී ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවටත් සිංහල ජාතියටත් මහත් කීර්තියක් ලබා දුන් සිංහල නිර්මාණකරුවන් කීප දෙනෙකු විසින් රචිත නමුත් දැනට ලක්දිව සොයා ගත නොහැකි ලෝකයේ විවිධ ස්ථානවල දක්නට ලැබෙන සුවිශේෂ සංස්කෘත නිර්මාණ කීපයක් ද අනුරපුර යුගයේ දී හමු වෙයි.

ඔවුන් අතුරින් ආර්යදේවපාදයන් ශ්‍රී ලාංකිකයෙකු බව සනාථ වූ කරුණකි. විධුශේඛර භට්ටාචාර්යයන් විසින් ප්‍රතිසංස්කරණය කරන ලද ආර්යදේවයන්ගේ චතුඃශතකය සංඥාපනයේ ආර්යදේව රජකම හැර දමා පැවිදි වූ සිංහල රජකුමරකු ලෙස හඳුන්වා දී ඇත.[65] ඔහු ශ්‍රී ලාංකිකයකු බව චීන තිබ්බත ග්‍රන්ථ ද එක හෙළා හඳුන්වයි.

ආර්යදේවයන් විසින් රචිත ග්‍රන්ථ ගණන දෙකකි. එනම්, චතුඃශතකය හා චිත්තවිශුද්ධිප්‍රකරණය යි. ඒ අතුරින් චතුඃශතකය වැදගත් ය. මෙහි ශ්ලෝක හාර සියයක් තිබේ යැයි සඳහන් වුවද දැනට ඇත්තේ ශ්ලෝක දෙසිය විසි පහකි. එය

නිකායන්තර මතවලින් කිළිටි නො වූ, ප්‍රතීත්‍යසමුත්පාදය, ශූන්‍යතාව, සංසාරය හා නිර්වාණය පිළිබඳ බෞද්ධ දෘෂ්ටියෙන් ඈත් නොවූ විදර්ශනාව හෙවත් අනිත්‍යය දුඃඛ අනාත්ම යන යථාභූත ඥාන දර්ශනය බුද්ධිමත්ව තර්කානුකූලව අවබෝධ කර දෙන්නා වූ ද බෞද්ධ දර්ශනයේ හරය ඇතුළත් ග්‍රන්ථයකි.

ඔහුගේ දෙවැනි කෘතිය චිත්තවිශුද්ධිප්‍රකරණය යි. පී. බෙන්ද්‍රාල් සංස්කරණය කළ සුභාෂිත සංග්‍රහයෙන් ද මහාමහෝපාධ්‍යාය හරිප්‍රසාද් ශාස්ත්‍රී ඉදිරිපත් කළ බෙන්ගාල ආසියාතික සමිති සඟරාවේ 175 පිටුවේ දැක්වෙන පාඨයෙන් ද එය ආර්යදේවගේ කෘතියක් බව ප්‍රකට වේ. චිත්තවිශුද්ධිප්‍රකරණය, ථේරවාදයට පහර ගසමින් වජ්‍රයානය, මහායානය ඒ නමින්ම හඳුන්වා දෙමින් භේදකාරී ව ලියූ නොගැඹුරු මතාන්තර සහිත සත්‍ය ඥානයට වඩා පක්ෂග්‍රාහී නිකායවාද අගයන ප්‍රකාශනවලින් යුක්ත වූවකි.

අනුරපුර අග භාගයේ දහවන සියවසේ ලංකාවෙන් ඉන්දියාවට ගොස් බෙංගාලයේ වෙසෙමින් රත්න ශ්‍රී ඥාන භික්ෂුව දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශයට පරිවාර ග්‍රන්ථයන් වශයෙන් රත්න ශ්‍රී ඥාන කාව්‍ය ලක්ෂණ ටීකාව නම් සංස්කෘත ග්‍රන්ථය රචනා කරන ලදි. අනුරපුර යුගයේ ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවටත් සිංහල ජාතියටත් මහත් කීර්තියක් ලබා දුන් සිංහල යතිවරයකු වූ රත්න ශ්‍රී ඥානපාදයන් ගැන මෙරට වැඩි දෙනෙකු තුළ අවබෝධයක් නැත. ජර්මන් ජාතික හෛන්ස් බෙෂාර්ඩ්, රත්න ශ්‍රී ඥාන හෝ රත්නශ්‍රී පාද අනුරපුර යුගයේ සාහිත්‍යයට නිර්මාණ එක් කළ තවත් සිංහල කවියෙකු ලෙසත් එම කෘති ප්‍රාදේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර මට්ටමින් ජන විශ්‍රැත ඒවා බවත් සඳහන් කරයි.

ලංකාද්වීපප්‍රසූත, පෘථුලකුලජලධි එනම්, මහාවංශ සාගර නම් මහානාම හිමියන්ගේ බුද්ධගයා සෙල් ලිපිය ද සාහිත්‍යධරයන්ගේ ද ඉතිහාසඥයන්ගේ විශේෂ අවධානයට ලක්වූවකි. ආචාර්ය සී. ඊ. ගොඩකුඹුර ලංකාවේ ජනප්‍රිය පද්‍යචූඩාමණි නම් සංස්කෘත බුද්ධ චරිතයේ කර්තෘ ද බුද්ධගයා සෙල් ලිපිය පිහිට වූ මහානාමන් හිමි බව පවසයි. ''පද්‍යචූඩාමණි නම් බුදු සිරිත කරණ ලද්දේ සිංහලද්වීපයේ සිංහල මහතෙර නමක් වූ මහාවංශය කළ, මහානාමන් තෙරපාණන් විසිනි. උන්වහන්සේ විසින් බුද්ධගයාවේ පිහිටුවා ඇති කාව්‍යමය ශිලා ලිපිය සිංහල භික්ෂූන් වහන්සේගේ සතු බසෙහි දූනුම විදහාපායි ''.[66]

දේවරක්ෂිත ජයබාහු ධර්මකීර්ති මාහිමියන් නිකාය සංග්‍රහයේ ''ධර්මානුගත ශ්ලෝක ප්‍රබන්ධ ඉපද වූ ගෘහස්ථ පණ්ඩිත ජනයන් අතර ශූරපාදය, ධර්මකීර්තිපාදය, ධීරනාගපාල/පාද, රාජමුරාරිය, කවිරාජශේඛර ආදී....'' වශයෙන් දැක්වෙන පරිදි, ධීරනාගපාල/පාද යන නමින් ද[67] කුන්දමාලා නම් නාටකයෙහි ''අනුරාධස්‍ය කවේර් ධීරනාගස්‍ය කෘතිඃ කුන්දමාලා නාම නාටකං සමාප්තම්'' යන කර්තෘ සංදර්ශක වැකියෙන් ද ධීරනාග යන නමින් හැඳින්වෙන ගෘහස්ථ පඬිවරයා මෙරට පාලි සංස්කෘත යන ජාත්‍යන්තර භාෂාවන් ගෙන් නිර්මාණ බිහි කළ තවත් කවියෙකි.

කුන්දමාලාවේ දැක්වෙන පරිදි අනුරාධපුරයක් ගැන අන්තැනක සඳහන් නොවන

නිසා ඉන් අනුපරාධපුරය අදහස් කරන බව පිළිගැනේ. ඇතැම් සංස්කරණවල අනුපරාධපුර අරාරාලපුර යන නම් දෙකෙන් ද හැඳින්වෙන්නේ ලංකාවේ අග නගරය වූ අනුරාධපුරය විය හැකි ය.

කුන්දමාලා කෘතිය පුරා රාම කුමාරයා නිර්දය ලෙස විවේචනයට භාජනය වන්නාසේ ඔහු ගේ පහත් චරිත ලක්ෂණ ඉස්මතු කොට දක්වන බැවින් මෙය හින්දු භක්තිවාදී භාරතීය කවියෙකුගේ නිර්මාණයක් සේ සැලකිය නොහැකිය. රාමායණයේ උත්තරරාම චරිතයේ සීතා මෙහෙසිය වනයට නෙරපා හැරපී කතා පුවත තේමා කර ගෙන මෙය රචනා කර ඇත.

ලක්දිව සංස්කෘත භාෂා ශාස්ත්‍රෝදයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ පොළොන්නරු යුගය යි. පළමුවන පරාක්‍රමබාහු රජුගේ සමයේ සිදු වූ නිකාය සාමග්‍රියෙන් පසු මහායාන බුදුදහම යම් තරමකට යටපත් විය. එහෙත් ඒ යුගයේ සංස්කෘත හැදෑරීමට එතරම් බාධාවත් නොවීය. බ්‍රාහ්මණ ආගම සම්බන්ධ භාෂා මාධ්‍යය වූයේ සංස්කෘතය යි. බෞද්ධ පාලකයන්නේ මෙන්ම කුමාරවරුන්ගේ ජීවිතයේ උපතේ සිට මරණය දක්වා වැදගත් කටයුතුවල දී බ්‍රාහ්මණයන් ප්‍රමුඛත්වයක් ගත් නිසා එහි දී සංස්කෘත භාෂාව යොදා ගන්නට ඇත. වෛද්‍ය ශාස්ත්‍රය, නක්‍ෂත්‍ර, ගණිතය, නීතිය හා දේශපාලනය වැනි ලෞකික විෂයයන් පිළිබඳ පොත පත ලියැවුනේ සංස්කෘත භාෂාවෙනි.

පොළොන්නරු යුගයේ හා ඊට පසු ලියැවුණු සිංහල ගද්‍ය පද්‍ය ග්‍රන්ථවල බහුල වශයෙන් සංස්කෘත ආභාසය දක්නට ලැබේ. සංස්කෘත භාෂාව පිළිබඳව නිපුණත්වයක් නොමැති අයෙකුට සිංහල නිවැරදි ව ලිවිය නොහැකි තරමට ම සංස්කෘත වචන පමණක් නොව වාක්‍ය ඛණ්ඩ ද මේ යුගයේ දී සිංහල ග්‍රන්ථවලට ඇදී එන්නට ඇත. සිංහල සෙල් ලිපිවල හා පොත් පත්වල බහුල වශයෙන් සංස්කෘත ශ්ලෝක යෙදීම කැපී පෙනෙන ලක්ෂණයක් විය.

ක්‍රි.ව. 1137 - 1153 වකවානුවට අයත් සේ සැලකෙන දේශපාලන තොරතුරුවලින් පරිපෝෂිත වේලයික්කාර පුවරු ලිපියේ[68] සංස්කෘත හා දෙමළ යන භාෂා දෙකම යෙදුණු අයුරු පෙනේ. ගල්පාත සෙල්ලිපිය[69] පළමුවන පරාක්‍රමබාහු යුගයට අයත් වූවකි. එය ආරම්භ වන්නේ සංස්කෘත ශ්ලෝකයකිනි.

ත්‍රිංශෙ භුවිභුජඃ පරාක්‍රමභුජස්‍යාබ්දෙ තදා දේශතස්

ශ්‍රද්ධාචාරදණ්ඩාධිකාරිවිභුතා නාම්නාමගෙන්ද්‍රන්තු

උත්තුඞ්ගාන්වයසම්භවෙන විදුෂා ක්ලුප්තාය සත්කීර්තිතා

ශෛලාන්තායතාය දත්තවිවිධග්‍රාමාදිසංඛ්‍යාවච්‍යනෙ

නිශ්ශංකමල්ල (ක්‍රි.ව 1187 - 1190) රජු විසින් පිහිටුවන ලද පුවරු ලිපියක්[70] ශ්‍රග්ධරා වෘත්තයෙන් බැඳුණු සංස්කෘත ශ්ලෝකයකින් අවසන් වේ. ඔහු විසින් පිහිටුවන ලද හැටදාගේ බරාඳ පුවරු ලිපිය[71] හා කලාක්‍රීඩා ගල් ආසන පුවරු ලිපිය[72]

ද සංස්කෘත ශ්ලෝකවලින් ආරම්භ වේ. මේ රාජ සමයට අයත් පොළොන්නරුවේ උතුරු වාහල්කඩ සමීපයෙන් සොයා ගන්නා ලද පුවරු ලිපියෙහි[73] සංස්කෘත කාව්‍ය ලක්ෂණ රැසක් පිළිබිඹු කරන සංස්කෘත ශ්ලෝක දෙකක් අඩංගු ය. නිශ්ශංකමල්ල රජුගේ ප්‍රීතිදායක මණ්ඩප සෙල් ලිපිය[74] ඇරඹෙන්නේ ද, ස්‍රග්ධරා වෘත්තයෙන් බැඳී මනහර සංස්කෘත පද්‍යයකිනි. සහස්සමල්ල රජ සමයේ පිහිට වූ පුවරු ලිපියක[75] එම රජු රාජ්‍ය පදප්‍රාප්තිය නිමිතිකොට බැඳුණු සංස්කෘත පද්‍ය දෙකක් දක්වේ. මෙලෙසින් පොළොන්නරු යුගයේ සෙල් ලිපිවල සංස්කෘත භාෂාව යොදා ගෙන තිබීමෙන් එම යුගයේ මෙම භාෂාව සම්භාවනාවට පාත්‍ර වී තිබූ බව පැහැදිලි වේ.

පොළොන්නරු යුගයේ දී සංස්කෘත භාෂා සාහිත්‍යය විවිධ ක්ෂේත්‍රවලට ව්‍යාප්ත වී ගියේය. පළමුවන පරාක්‍රමබාහු රජුගේ සමයේ සිදු කළ නිකාය සාමග්‍රිය සම්බන්ධයෙන් අනුශාසනා කළ උදුම්බරගිරිවාසී මහා කාශ්‍යප හිමි ඒ යුගයේ විසූ සම්භාව්‍ය උගතෙකි. සංස්කෘත ව්‍යාකරණය පිළිබඳ විශේෂඥයෙකු වූ උන් වහන්සේ චාන්ද්‍රව්‍යාකරණය අනුව යමින් සූත්‍ර හාරසිය හැත්තෑ නවයකින් යුක්ත බාලාවබෝධන නම් සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථයක් රචනා කළහ.[76] චාන්ද්‍රව්‍යාකරණ සම්ප්‍රදාය අයත් වූද, ලංකාවේ රචනා වූ මෙතෙක් ප්‍රකාශයට පත් නොවූ ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයක් ද ඇත. එනම්, බුද්ධනාග තෙරුන්ගේ ලීනාර්ථදීප හෙවත් පාත්‍රීකරණ ටීකාව යි.[77] ව්‍යාකරණකාර ගුණාකාරයන්ගේ පාත්‍රීකරණ නම් ග්‍රන්ථයට ටීකාවක් වශයෙන් මෙය ලියන ලද බව මෙහි දෙවැනි ශ්ලෝකයෙන් කියැවේ.

මේ යුගයට අයත් සංස්කෘත ග්‍රන්ථ ව්‍යාකරණ හා ව්‍යාඛ්‍යාන ගණයට සීමා නොවීය, මයූර, අමරු, භර්තෘහරී වැනි භාරතීය සංස්කෘත රචකයන්ගේ ශතක කාව්‍යවලින් ආභාසය ලත් කාව්‍ය අතර අග්‍රගණ්‍යතම වූයේ ලක්දිව රචිත ප්‍රථම ශතක කාව්‍ය ලෙස සැලකෙන අනුරුද්ධ ශතකය යි.[78] මෙය බුදුරදුන්ගේ ගුණයන් වර්ණනා කරමින් රචනා කරන ලද්දකි. මෙහි සංඥා නාමයෙන් ම ඇඟෙන පරිදි උත්තරමූල ආයතනයේ වැඩ සිටි අනුරුද්ධ හිමියන්ගේ කෘතියකි. මෙහි පද්‍ය එකසිය එකක් වේ. නිරාකුල ප්‍රකාශන, ශබ්ද මාධුර්යය හා අර්ථලාවණ්‍ය එහි ඇති සුවිශේෂී ලක්ෂණ යි.[79]

පොළොන්නරු යුගයට අයත් සේ සැලකෙන මේ වර්ගයේ තවත් කාව්‍ය ග්‍රන්ථයකි නාමාෂ්ට ශතකය. බුදුන් වහන්සේගේ ගුණ නාම එකසිය අටක් අළලා වර්ණනා පූර්වක ව පද්‍යවලින් යුක්ත රචනා කර ඇත.[80] මෙහි කතුවරයා අඥාත ය. මෙය තරමක් කුඩා ග්‍රන්ථයකි. පද්‍ය ගණන එකසිය අටක් පමණ වේ. නාමාෂ්ට ශතකයට තරමක් කුඩා තවත් ග්‍රන්ථයක් මේ යුගයෙන් ම හමුවෙයි. එනම්, බුද්ධ ගද්‍යය යි.[81] මෙහි ද කතුවරයා අඥාත ය. මෙය සරල ශෛලියකින් රචිත ය. බෞද්ධ වෙහෙර විහාරස්ථානවල සංස්කෘත භාෂාව හදාරන ආධුනිකයන්ගේ ප්‍රයෝජනය සඳහා මෙය රචනා කර ඇත. එහි වෘත්ත දාහතරකින් බඳනා ලද පද්‍ය හතලිස් එකක් වේ. බුද්ධ ගද්‍යය තරම් ම කුඩා වූ තවත් ගද්‍ය ප්‍රබන්ධයකි, සකස්කඩය.[82] ආධුනික සංස්කෘත ශාස්ත්‍රාභිලාෂීන් ගේ උච්චාරණ ක්‍රමය සකස් කිරීමේ පරමාර්ථයෙන් මෙය රචනා කරන ලදි. සියයට අනූ පහක් සංස්කෘත වචන භාවිත කරමින් ඉතිරි සියයට පහ සිංහල පද යොදා මෙය ලියා ඇත. මෙම කුඩා ග්‍රන්ථය රචනා කළ කාලය ස්ථිර

වශයෙන් ප්‍රකාශ කළ නොහැකි ය. අන්තර්ගත කරුණු භාෂාව හා සන්දර්භය අතින් අනුරුද්ධ ශතකයට බොහෝ දුරට සමාන වීම නිසා පොළොන්නරු යුගයට අයත් යයි නිගමනය කළ හැකි ය.

පොළොන්නරු යුගයේ සංස්කෘත භාෂා සාහිත්‍යය සිංහල සාහිත්‍යය කෙරෙහි දක්වන ලද බලපෑම ඉතා මහත් ය. දොළොස්වන ශතවර්ෂයට අයත් පරාක්‍රමබාහු රජුගේ පොළොන්නරු කතිකාවත සංස්කෘත වචන බහුල ව යොදමින් රචනා කරන ලද සිංහල කෘතියකි. ''මහාසම්මතාදී පරම්පරායාත සූර්යවංශෝද්භූත රාජාධිරාජ නෛකදිශාභිව්‍යාප්ත යසෝමරීචීන් විරාජමාන ශ්‍රී සංඝබෝධි පරාක්‍රමබාහු මහා රජාණන් සකල ලංකා තෙළෙහි ඒකරාජ්‍යාභිෂේකයෙන් අභිෂිප්ත වැ විජම්භිත පුණ්‍යර්භී ඇති ව රාජ්‍යසුඛානුභාව කොටැ....''[83] මෙම පාඨයෙ හි ඇති වචන තිස්තුනෙන් විසි හයක්ම සංස්කෘත පද යි. මෙයින් පෙනී යන්නේ පොළොන්නරු යුගයේ දී සංස්කෘත පද බහුල ව යොදා සිංහල ග්‍රන්ථ රචනා කළ බව යි.

මහාබෝධිවංස ගැටපදය (ක්‍රි.ව. 1153 - 1202) පොළොන්නරු යුගයේ විසූ සංස්කෘත භාෂාව උගත් කතුවරයෙකුගේ නිර්මාණයකි. මෙය පාලිබෝධිවංසයේ දුරවබෝධ ස්ථාන පැහැදිලි කිරීම සඳහා කරන ලද්දකි. මෙහි කතුවරයා භාෂාව හා සාහිත්‍යය පිළිබඳ තම පණ්ඩිත්‍ය හා ප්‍රවීණත්වය ගෙන හැර දැක්වීම සඳහා නොයෙක් තැන්වලදී සංස්කෘත භාෂා ඥානය උපයෝගී කරගෙන ඇත. සංස්කෘත පද හා වාග් සම්ප්‍රදායන් බහුල ව දක්නට ලැබේ. දීර්ඝ වාක්‍යවලින් හා සමාස පදවලින් යුක්ත ය. පාලි වචනවලට සංස්කෘත රූප යොදා වාක්‍ය රචනා කොට ඇත. ව්‍යාකරණ විභාගවලදී සංස්කෘත ක්‍රමය අනුගමනය කර ඇත. පාණිනී, චන්ද්‍රගෝමීන්ගේ ව්‍යාකරණ නීති ද උපුටා දක්වා ඇත.

රඝුවංශය, ජානකීහරණය, මේඝදූතය, කාදම්බරිය වැනි සංස්කෘත ගද්‍ය පද්‍ය නිර්මාණවලින් උපුටාගත් ගද්‍ය පද්‍ය කොටස් රාශියක් මෙහි දක්නට ලැබේ.''

''ක්ව සූර්යප්‍රභවෝ වංශඃ''.... රඝු... 1 - 2[84]

''සොහමාජන්ම ශුද්ධානම්''.... රඝු.... 1 - 5[85]

''සුගන්ධිසෞගන්ධිකගන්ධහෘද්‍ය.... ජානකීහරණය 1 - 65[86]

''තත්විශ්‍යාමා ශිඛරිදශනා රක්වබිම්බාධරෝෂ්ඨී...මේඝදූතය[87]

කදම්බරියෙන් උපුටාගත් ශ්ලෝකයක් ද මහාබෝධිවංශ ගැටපදයේ දක්නට ලැබේ.

කටුක්වණනතො මලදායකාඃ බලා
ස්තුදන්ත්‍යලං බන්ධනශාංඛලා ඉව
මනස්තු සාධුධ්වනිබිඃ පදෙ පදෙ
හරන්ති සනේතා මණිනූපුරා ඉව[88]

මහා බෝධිවංශ ගැටපද කතුවරයා කාලිදාස, කුමාරදාස, බාණ, හර්ෂ, චන්ද්‍රගෝමි ආදි සංස්කෘත කවීන්ගේ ග්‍රන්ථවලින් උපුටා දැක්වීම තත්කාලීන සාහිත්‍යයේ හා බොහෝ දුරට සංස්කෘතයෙන් පෝෂණය වූ බවට පැහැදිලි සාක්ෂියකි.

පළමුවැනි පරාක්‍රමබාහු යුගයේ විසූ ශාරිපුත්‍ර හිමියන්ගේ අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය ද සංස්කෘතයට ගැති කෘතියකි. සංස්කෘත පද බහුල මිශ්‍ර සිංහල භාෂාවක් යොදා ගත් නමුදු පාලි පදවලට සංස්කෘත වේශයක් දීම මෙහි ලක්ෂණය යි. ජාතක අටුවා ගැටපදය, ධම්පියා අටුවා ගැටපදයට වඩා සංස්කෘත භාෂා විලාශයට ඉඩදී රචනා වූවකි. ව්‍යාකරණ ලක්ෂණ දැක්වීමේ දී බහුල ව සංස්කෘත පද හා වාග් සම්ප්‍රදාය උපයෝගී කර ගනී. සමහර අවස්ථාවල ජාතක අටුවා ගැටපදයේ සංස්කෘත ශ්ලෝක පවා දක්නට ලැබේ.

පොළොන්නරු යුගයේ අවසාන භාගයට අයත් සේ සැලකෙන මුවදෙව්දාවත, සසදාවත, කව්සිළුමිණ වැනි ගී කාව්‍යවල අලංකාර, අන්තර්ගතය, වර්ණනා ආදියෙහි ලා සංස්කෘත බලපෑම සුවිශාල ය. කුමාරදාස, කාලිදාස, බාණ, භාරවී, මාඝ, භර්තෘහරී වැනි සංස්කෘත කවීන්ගේ කෘතිවලින් පාඨ උපුටාගත් අවස්ථා රාශියක් ඉහත කී ගී කාව්‍යවල දක්නට ලැබේ. කව්සිළුමිණේ පබාවතී මඟුල් උලෙළ වැනුම, රඝුවංශයේ අජ-ඉන්දුමතී ගෘහාභිනිවේශ වර්ණනාව ඇසුරින් ද, කුස විලාපය රඝුවංශයේ එන අජ විලාපය ඇසුරින් ද නිර්මාණය කර ගෙන ඇත.

මෙයට අමතරව වෛද්‍ය විද්‍යාව, නක්ෂත්‍ර විද්‍යාව ව්‍යාකරණ වැනි සිංහලෙන් ලියැවුණු ග්‍රන්ථ සියල්ලටම පාහේ සංස්කෘත භාෂාවේ බලපෑම් ලැබී ඇත.

පොළොන්නරු යුගයෙන් පසු උදා වූ දඹදෙණි යුගයේ මුල් අවස්ථාවේ හෙවත්, පොළොන්නරු යුගයේ අවසාන භාගයේ මෙරට විසූ ශ්‍රේෂ්ඨ ගිහි පැවිදි පඬිවරු සංස්කෘත භාෂා සාහිත්‍යය කෙතරම් පරිශීලනය කළෝ ද යන්න ඔවුන් තම නිර්මාණ සඳහා ඇසුරුකළ මූලග්‍රන්ථ සමූහයෙන් පැහැදිලි වේ. ගුරුළුගෝමින් ගේ ධර්මප්‍රදීපිකාවේ දී එතුමන් බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ රැසක් ඇසුරු කර ඇත. ඒ අතර, ධර්මකීර්ති පාදයන්ගේ ප්‍රමාණවාර්තිකය, ආර්යශූරපාදයන්ගේ ජාතකමාලාව, ශාන්ති දේවපාදයන්ගේ බෝධිචර්යාවතාරය, චන්ද්‍රගෝමින්ගේ ශිෂ්‍යලේඛාව ආදි විවිධ සංස්කෘත ග්‍රන්ථ ඒ අතර වේ.[89] ඒ ඒ කෘතිවලින් උපුටාගත් පාඨ ගුරුළුගෝමිහු තම නිර්මාණයෙහි ඒ ඒ තැන බහාලූ හ.

දෙවෙනි පැරකුම්බා රජතුමා විසින් රචිත විශුද්ධිමාර්ග සන්නය, දඹදෙණි යුගයට අයත් තවත් සිංහල කෘතියකි. දහම් කරුණු සනාථ කිරීමේ දී බෞද්ධ සංස්කෘත ආචාර්යවරුන්ගේ මත ගෙනහැර පා ඇති අතර, බුද්ධඝෝෂ හිමියන්ගේ සෞන්දරනන්දය, වසුබන්ධුගේ අභිධර්මකෝෂය යන ග්‍රන්ථ දෙක නමින්ම හඳුන්වා ඇත. නාගබෝධි, දින්නාග, ජෝතිපාල, රාහුලපාද, රේවත ආදි ආචාර්යවරුන්ගේ නම් මෙම කෘතියෙන් හමු වේ. ගාඪ සංස්කෘත භාෂාවකින් තම කෘතිය සරසන්නට පැරකුම්බාවන් ගත් උත්සාහය කැපී පෙනේ. විශුද්ධිමාර්ග සන්නයේ භාෂාව කෙතරම් සංස්කෘතයට නතු වී ඇද්ද යන්න පහත වැකිය සාක්ෂි දරයි.

''ඉහි ප්‍රියශීලී ප්‍රතිපත්ති වත්සල සුරක්ෂිත මුමුක්ෂියෝගී ජනයාහට ප්‍රීත්‍යුත්පාදනය මුඛ්‍යප්‍රයෝජනය චතුස්පාරිශුද්ධි සීලයෙහි සුප්‍රතිෂ්ඨිත වැ අධිශීල සිද්ධකොට ස්වචරිතානුකූලව...''[90]

දඹදෙණි යුගයේ සිංහල සාහිත්‍ය කෙරෙහි පමණක් නොව පාලි ග්‍රන්ථ රචනයේ දී පවා සංස්කෘත ග්‍රන්ථවල ආභාසය ලැබී ඇත. විශේෂයෙන් ම පාලි ග්‍රන්ථවල විස්තර වන කථා නායකයන් හා ඔවුන්ගේ ජීවන සිද්ධීන් දැක්වීමේදී මෙම ලක්ෂණය කැපී පෙනෙයි. පාලි, හත්ථවනගල්ල විහාරවංසයේ සිරිසඟබෝ චරිත කථාව විස්තර කිරීමේ දී සංස්කෘත කදම්බරියේ ගද්‍ය කොටස් පරිවර්තනය කොට දක්වා තිබේ. බෝධිසත්ත්ව චරිත කථා දැක්වීමේ දී ආර්යශූරපාදයන්ගේ ජාතකමාලාවේ පද්‍ය විස්සක් පාලියට ගනා ගෙන ඇත. හත්ථවගල්ල විහාරවංසයේ පද්‍ය හා ජාතකමාලාවේ පද්‍ය සංසන්දනය කර බැලීමේ දී අපට පෙනී යන්නේ ජාතකමාලාව ළඟ තබා ගෙන හත්ථවනගල්ල විහාරවංසය රචනා කළ බවයි.

දඹදෙණි යුගයේ විසූ සංඝරක්ෂිත ස්වාමිපාදයන් වහන්සේ විසින් සුබෝධාලංකාරය නම් පාලි අලංකාර ග්‍රන්ථය ද වුත්තෝදය නම් පාලි ඡන්දස් ග්‍රන්ථය ද රචනා කරන ලදි. මෙයින් සුබෝධාලංකාරය දණ්ඩින්ගේ කාව්‍යදර්ශනය අනුව ද වුත්තෝදය ශ්‍රී කේදාරභට්ටයන්ගේ වෘත්තරත්නාකරය අනුව යමින් ද සම්පාදිත ය. මේ කෘති දෙක සම්පාදනය කිරීමේ දී උක්ත ග්‍රන්ථ දෙකට අමතරව වාමන, හර්තෘහරී, රාමශර්මන් ආදීන්ගේ අලංකාර ග්‍රන්ථ පිංගලනාගයන්ගේ පිංගල ඡන්දස් ද ඇසුරු කළ බව දැක්වේ. සිදත්සඟරාව වැනි සිංහල ව්‍යාකරණ කෘතිවලට ආභාසය ලැබී ඇත්තේ ද සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථවලින් බව කිවයුතු ය.

ඉහත තොරතුරුවලින් පැහැදිලි වන්නේ ලක්දිව සංස්කෘත භාෂා සාහිත්‍යය දඹදෙණි යුගයේ කෙතරම් ජනප්‍රිය ව පැවතිය ද යන්න ය. එසේ ම ගර්භිතවිද්‍යා ලෙස සැලකූ සංස්කෘත භාෂාව දඹදෙණි සමයේ දී මෙතරම් ජනප්‍රියවීම සංස්කෘතය ලක්දිව කෙතෙක්දුරට තහවුරුව තිබුනේ ද යන්නට නිදසුනකි.

මේ යුගයේ බෞද්ධ භික්ෂූන් සංස්කෘත භාෂාව හැදෑරීමේ ප්‍රතිඵල වශයෙන් දෙවෙනි පරාක්‍රමබාහු රජුගේ සමයේ (ක්‍රි.ව 1236 - 1270) සංඝරාජ ධුරය දැරූ බ්‍රාහ්මණ වංශික අනෝමදස්සී නම් තෙර කෙනෙකුන් විසින් දෛවඥ කාමධෙනුව නම් කෘතියක් රචනාකර ඇත.[91] තාරකා ශාස්ත්‍රය හා නක්ෂත්‍ර විද්‍යාව අළලා මේ කෘතිය නිර්මාණය කොට ඇත. අධ්‍යාය දහය බැගින් වූ ප්‍රකරණ තුනක් වශයෙන් මේ කෘතිය රචනා විය. මෙහි පද්‍ය ගණන දෙදහස් හයසිය දහ අටකි. සිදත්සඟරා කතුවර පතිරාජ පිරිවෙන්පති හිමියන් විසින් ම මෙය රචනා කරන ලද බවට ප්‍රබල සාක්ෂි ග්‍රන්ථ දෙකෙහි දක්නට ලැබෙන කරුණු සැසඳීමෙන් ලබාගත හැකි ය. දෛවඥකාමධේනුව රචනා කිරීමේ දී වරාහමිහිරගේ වෘහත්සංහිතා, පරාශරයන්ගේ හෝරාශාස්ත්‍ර, භෝජදේවයන්ගේ සරස්වතීබණ්ඩාභරණය ආදි පුරාණ ජ්‍යෝතිෂ්ශාස්ත්‍ර ග්‍රන්ථයන් පරිශීලනය කොට ඇති බව පෙනේ. ලක්දිව සංස්කෘත අධ්‍යයන කටයුතු නව ක්ෂේත්‍රයකට පිවිසීම මෙවැනි කෘතිවලින් හෙළි වේ. මේ යුගයේ විසූ, ශාරිපුත්‍ර තෙරණුවෝ රත්න ශ්‍රී ඥානයන්ගේ

ටීකාවක් ලියූහ. උන්වහන්සේ විසින් පදාවතාර නමැති සංක්ෂිප්ත සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථයක් ලියන ලද බව කියනු ලැබේ.[92]

දඹදෙණි යුගයෙන් පසු උදා වූ කුරුණෑගල අවධියේ දී, භාෂා පරිහානිය නිසා සංස්කෘත භාෂාව ද එතරම් දියුණු තත්ත්වයක නො තිබුණි. එහෙත් විල්ගම්මුල සංඝරාජ හිමියන් වැනි ශ්‍රේෂ්ඨ පඬිවරුන්ගේ දායකත්වයෙන් එක්තරා ප්‍රමාණයකට සංස්කෘත භාෂා ශාස්ත්‍රීය කටයුතු පැවති බවට තොරතුරු හමුවේ. විල්ගම්මුල හිමියන් ලියූ සිංහල බෝධි වංශය වැනි කෘතිවල සංස්කෘත භාෂාවේ ප්‍රභාව බොහෝ සේ දක්නට ලැබේ. සිංහල බෝධිවංශයේ අවසානයේ සංස්කෘතයෙන් බැඳි ශ්ලෝකයක් දක්නට ලැබේ.

චරිතසුචරිතශ්‍රීපරක්‍රාන්තිබාහු
ක්‍ෂතිපතිලකකෞජනාරාධනාන්දිතේත
සකලගුණනිධානශ්‍රීසරෝග්‍රාමමූල
ස්ථවිරයතිවරෙණෙල්ලාසිනො බෝධිවංශඃ[93]

කුරුණෑගල යුගයෙන් පසු සංස්කෘත භාෂා සාහිත්‍යයේ අභිවර්ධනයක් වූයේ ශ්‍රී ජයවර්ධනපුර රාජධානි සමයේ ය. මේ යුගය සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස අභිෂේක ලැබූයේ සිංහල සාහිත්‍යයේ විවිධ සාහිත්‍යාංග ඔස්සේ උසස් නිර්මාණ හේතුකොටගෙන ය. ඒ අයුරින් තොටගමුවේ විජයබා පිරුවන්පති සිරි රහල් හිමියන් ලියූ පඤ්චිකාප්‍රදීපය කෝට්ටේ යුගයේ ලක්දිව සංස්කෘත භාෂාව ව්‍යාප්ත වූ තරම ප්‍රකට කරයි. මුද්‍රිත පිටු 167කින් යුක්ත මේ කෘතිය දූනට අපට නාමමාත්‍රයෙන් අසන්නට ඇති බොහෝ සංස්කෘත ග්‍රන්ථවලින් කරුණු උපුටා ගෙන රචනා කරන ලද්දකි. සංස්කෘත ග්‍රන්ථ පණස් දෙකක් පමණ ඒ සඳහා පරිශීලනය කළ බව කෘතියේ අන්තර්ගතයෙන් හෙළිවේ. කෝට්ටේ යුගයේ ලක්දිව සංස්කෘත සාහිත්‍යය කෙතරම් ව්‍යාප්තව පැවතියේ ද යන්න තේරුම් ගැනීමට මේ එක ම කෘතිය වුව ද ප්‍රමාණවත් ය.

පැරකුම්බා සිරිත නම් පද්‍ය කාව්‍යය, සංස්කෘත වචන සිංහල උෟරුවට සකස් කරගෙන කරන ලද නිර්මාණයකි. කෝට්ටේ යුගයේ රචිත එකම සංස්කෘත නිර්මාණය ලෙස ඉතිහාසයට එකතුවන්නේ රාමචන්ද්‍රකවිභාරතී නම් භාරතීය පඬිවරයාගේ භක්තිශතකය හෙවත් බෞද්ධ ශතකය යි. මෙයට අමතරව, මහනෙත්පාමුල විසූ රම්මුන්ගොඩ දීපඞ්කර හිමියන්ගේ ජීවන චරිතයක් වූ වෘත්තමාලාඛ්‍යාවත්, වෘත්තරත්නාකරයේ ව්‍යාඛ්‍යාවක් වූ වෘත්තරත්නාකර පඤ්චිකාවත් සංස්කෘතයෙන් ලියැවී ඇත. මෙම වෘත්තරත්නාකර පඤ්චිකාව රාමචන්ද්‍රගේ නිර්මාණයකි. ඉහතින් දක්වන ලද බෞද්ධශතකය මේ යුගයේ ලියැවුණු උසස් නිර්මාණයකි. ක්‍රමයෙන් පිරිහෙමින් පැවති සංස්කෘත භාෂාඥානය යම් තරමකට හෝ නගා සිටුවීමට ගත් උත්සාහයක් සේ මෙය අගය කළ හැකි ය.

ජයවර්ධනපුර - කෝට්ටේ යුගයෙන් පසු ලංකා රාජ්‍යයේ පැවති අස්ථාවරබව, විදේශ ආක්‍රමණ පාලකයන්ගේ අනුග්‍රහ නො ලැබීම, ගිහි පැවිදි උගතුන් තුළ

ග්‍රන්ථකරණයට තරම් සුදුසු නිදහස් මානසිකත්වයක් නොමැතිකම ආදි කරුණු කිහිපයක් හේතු කොට ගෙන සංස්කෘත භාෂා සාහිත්‍යය ක්‍රමයෙන් පිරිහෙන්නට විය. මහනුවර යුගය දක්වා කිසිදු උසස් නිර්මාණයක් බිහි නොවිණි.

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහයෙන් මහනුවර යුගයේ වැලිවිට අසරණසරණ සරණංකර සංඝරාජයාණන් වහන්සේගේ මූලිකත්වයෙන් ඇති වූ ශාසනික ප්‍රබෝධයේ ප්‍රතිඵල වශයෙන් භාෂා ශාස්ත්‍ර විෂයෙහි නව පිබිදීමක් ඇති විය. සිංහල, පාලි භාෂාවන්ගෙන් නව නිර්මාණ රැසක් බිහි වූ අතර, සංස්කෘත භාෂාවෙන් රචිත අෂ්ටක නම් ප්‍රබන්ධ රැසක් හමුවේ. ඒ අතර, කරතොට ධම්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් රචිත නරේන්ද්‍රරාජ අෂ්ටකය[94] ශාර්දූල වික්‍රීඩිත වෘත්තයෙන් පද්‍ය ගොතා බඳනා ලද්දකි. අෂ්ටක යන නාමයේ අර්ථයෙන් ම ප්‍රකාශ වන පරිදි මෙහි පද්‍ය ගණන අටකි. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ (ක්‍රි.ව 1744 - 1779) මලණු කෙනෙකුට සුබපතමින් රචනා කරන ලද මෙය ප්‍රශස්ති කාව්‍යයක් සේ අගය කළ හැකි ය.

ජෝර්ජ්රාජ අෂ්ටකය මේ යුගයේ ලියැවුණු තවත් නිර්මාණයකි. මෙය එංගලන්තයේ iii ජෝර්ජ් රජු වෙනුවෙන් ලියවුණු මෙම අෂ්ටකය ද කරතොට ධර්මාරාම ස්වාමීන් වහන්සේගේ නිර්මාණයක් බව සැලකේ. මෙයට අමතරව දළදා අෂ්ටක,[95] මංගල අෂ්ටක, නමස්කාර අෂ්ටක, විජේන්ද්‍රාදී අෂ්ටක, අෂ්ටක පොත ආදි කෙටි නිර්මාණ රැසක් මේ යුගයේ දී බිහි විය. එහෙත් මේ යුගයේ පැවති ශාස්ත්‍ර පරිහානිය මෙම කෘතිවලින් වසා ලන්නට නොහැකි ය.

19 වන ශතවර්ෂයේ ඇති වූ භාෂා ශාස්ත්‍ර දියුණුවේ ප්‍රතිඵල වශයෙන් කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙණ හා කැලණියේ විද්‍යාලංකාර පිරිවෙණ බිහිවිණි. මෙම පිරිවෙන් දෙක ඇසුරු කොට වැඩ සිටි හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, රත්මලානේ ශ්‍රී ධම්මාරාම නාහිමි, රත්මලානේ ධම්මාලෝක නාහිමි ප්‍රමුඛ ගිහි-පැවිදි පඬිවරු සංස්කෘත සාහිත්‍යය පෝෂණය කිරීමෙහි ලා නිර්මාණ කටයුතුවල නිරතවූහ. විද්‍යාලංකාර පිරිවෙන්පති ව වැඩ විසූ රත්මලානේ ශ්‍රී ධර්මාරාම හිමියෝ කුමාරදාස කවියාගේ ජානකීහරණ මහා කාව්‍යයේ මුල් පිටපත අතුරුදහන්ව පැවති බැවින්, එහි සිංහල පදගතාර්ථ සන්නයක ආධාරයෙන් සර්ග 11 කින් යුතු එම කාව්‍යයේ මුල් කොටස සංස්කරණය කළහ. ඒ 1899 වර්ෂයේ දීය. උන් වහන්සේ විසින් ම අනුභූතිස්වරූපාචාර්යයන් ගේ සාරස්වත ව්‍යාකරණය අනුව යමින් ශික්ෂාසංග්‍රහ නමින් සංස්කෘත ව්‍යාකරණයක් රචනා කළහ. අධ්‍යාය දහයක් පරිමිත එම කෘතිය 1929 වසරේ දී ප්‍රකාශයට පත් කර ඇත.

විද්‍යෝදය මහ පිරිවෙනේ පරිවෙණාධිශ්වර ව වැඩ විසූ කහවේ ශ්‍රී රතනසාර හිමියන් විසින් සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථයක් 1914 දී රචනා කරන ලදි. එහි සංස්කෘත ශ්ලෝක 168 ක් වේ. සංස්කෘත ප්‍රවේශ නැමැති එම කෘතිය සිංහල සන්න සහිත ව පරිච්ඡේද හයකින් යුක්ත ය. මෙය ලක්දිව පුරා සංස්කෘත ව්‍යාකරණය හදාළ බොහෝ ශිෂ්‍ය පිරිසකට හස්තසාර කෘතියක් වේ.

අනුභූතිස්වරූපාචාර්යයන් විසින් රචනා කළ සංස්කෘත සාරස්වත ව්‍යාකරණයට සිංහල පරිවර්තනයක් මේ යුගයේ නොතිබුණ බැවින් කහවේ

රතනසාර හිමිපාණෝ කාණ්ඩ හතරකින් යුක්තව පරිවර්තන කෘති රචනා කළහ. සංඥා සන්ධි, නාම, කාරක, සමාස තද්ධිත, ආඛ්‍යාත වශයෙන් කොටස් හතරකට බෙදා සන්න හතරක් රචනා කොට ඇත. ඉතිරි වූ කෘදන්ත කොටසට හැගොඩ ධම්මින්ද හිමියන් විසින් සංස්කරණයෙන් යුතු පරිවර්තනයක් රචනා කොට ඇත.

සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථ පමණක් නොව සිංහල වෛද්‍ය ශාස්ත්‍ර අළලා විසිවන ශතවර්ෂයේ මුල් භාගයේ අලුත් කෘතියක් බිහිවිය. ක්‍රි.ව 1919 දී ප්‍රකාශයට පත් වූ වෛද්‍යෝත්තම්ස යනු එම කෘතියයි. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ ශිෂ්‍ය, ජේ.එස් රාජසුන්දර ආරච්චි නැමැත්තෙක් මෙහි කතුවරයා වේ. කොටස් 48කින් හා පද්‍ය 401 කින් මේ කෘතිය පරිමිත ය.

රාවණ යුගයේ සිට පැවතෙන ලංකා සංස්කෘත සාහිත්‍යයේ විසි වන සියවස වන තුරු පහළ වූ ගද්‍ය කාව්‍යයක් පිළිබඳ තොරතුරු හමු නොවේ. මෙරට රචනා කරන ලද ප්‍රථම සංස්කෘත ගද්‍ය කාව්‍යය සේ සැලකෙන්නේ විසි වන සියවසේ දොඩම්ගොඩ සීලක්ඛන්ධ නම් යතිවරයකු විසින් රචිත සද්ධර්මමකරන්ද කාව්‍යයයි. 1911 වර්ෂයේදී ප්‍රකාශයට පත් කොට ඇති මෙය සම්පූර්ණයෙන්ම සංස්කෘත දේවනාගරී අකුරෙන් මුද්‍රණය කර ඇත. අධ්‍යාය නමින් හැඳින්වෙන පරිච්ඡේද විසි පහකින් පරිමිත මේ ගද්‍ය කාව්‍යය සද්ධර්ම නැමැති අමෘතය විස්තර කරන බැවින් සද්ධර්මමකරන්දය යන නමින් හඳුන්වා ඇත. බුද්ධචරිතය හෝ ඒ හා සම්බන්ධ කථා ප්‍රවෘත්තියක් සංස්කෘත නිර්මාණයක් සඳහා ප්‍රථමවරට වස්තු විෂය වශයෙන් යොදා ගත්තේ අශ්වඝෝෂපාදයන් ය. උන් වහන්සේ බුද්ධචරිතය ඇසුරුකොට බුදු උපතේ සිට බුද්ධත්වය දක්වා තොරතුරු ඇතුළත් කරමින් සර්ග දාහතරකින් පරිමිත බුද්ධචරිත මහාකාව්‍යය ද, සුන්දරීනන්දා කථා පුවත මුල්කරගෙන සෞන්දරනන්දය සර්ග දහඅටකින් පරිමිතව සෞන්දරනන්ද මහා කාව්‍ය ද රචනා කළහ. එතැන් පටන් විවිධ නිර්මාණකරුවන් සංස්කෘත නිර්මාණ සඳහා බුද්ධචරිතය හා සම්බන්ධ සිදුවීම විෂය කරගත් නමුත්, සංස්කෘත ගද්‍ය කාව්‍යයක් සඳහා බුද්ධ චරිතය යොදා ගත් ප්‍රථම අවස්ථාව සද්ධර්ම මකරන්දයෙන් ප්‍රකට වේ.

බෞද්ධ සංස්කෘත ග්‍රන්ථයක් සේ අගය කළ හැකි මෙය සම්පූර්ණයෙන් ත්‍රිපිටක පාලිය හා පාලිප්‍රකරණ ග්‍රන්ථ අනුසාරයෙන් නිර්මාණය කරන ලද්දකි. කතුවරයා දක්වන පරිදි, සූත්‍ර, විනය, අභිධර්ම යන ත්‍රිපිටකයට අයත් දීඝනිකාය, මහාවග්ගපාලිය, යන පෙළ ග්‍රන්ථ ද සුමංගලවිලාසිනී සමන්තපාසාදිකා ආදි අටුවා ග්‍රන්ථ ද විසුද්ධිමග්ග, ජාතකට්ඨකථා යන ප්‍රකරණ ග්‍රන්ථ ද මහාවංසය හා සම්බුද්ධවිලාසිනී ආදි ග්‍රන්ථ සමුදායයක් පරිශීලනය කිරීමෙන් මේ ග්‍රන්ථය රචනාකර ඇත. මේ කෘතිවලින් ලද ආභාසය තුළින් රචිත සද්ධම්මකරන්දය පාලි ආරුව සහිත සංස්කෘත නිර්මාණයකි.

''නමස්තස්මෛ භගවතේර්හතෙ සම්‍යක්සම්බුද්ධාය'' යන බෞද්ධ සංස්කෘත උගතුන් අනුමනය කළ ඉෂ්ටදේවතානුස්මරණයෙන් කෘතිය ආරම්භ කරන කවියා පිළිවෙළින් සුමේධ තාපස කථාව, දසපාරමිතාවන් සම්පූර්ණ කිරීම, දීපංකර පාද මූලයේ විවරණ ලැබීම, කොණ්ඩඤ්ඤ බුදු රදුන් ඇතුළු සුවිසි බුදුවරුන්ගෙන් විවරණ ලැබීම ආදි තොරතුරු පස්වන අධ්‍යාය දක්වා විස්තර කරයි. එතැන් සිට

තුසිත දෙව්ලොව සිට බෝසතුන් මවුකුස පිළිසිඳ ගැනීම, කිඹුල්වත ඉපදීම, ගත ලකුණු ප්‍රකාශ කිරීම, අභිනිෂ්ක්‍රමණය, අනෝමා ගංතීරයේදී ශ්‍රමණ වෙස් ගැනීම, උරුවේලාවෙහි දුෂ්කරක්‍රියා කිරීම, සුනානි ජනපදයේ සුජාතාවගේ කිරිපිඩු පිළිගැනීම, මාරපරාජය, බෝමැඩ දී බුද්ධත්වයට පත්වීම, සත් සතිය (දින හතලිස් පහක්) ගත කිරීම, ප්‍රථම ධර්මදේශනාවට බ්‍රහ්ම ආරාධනාව හා ධර්මචක්‍රප්‍රවර්තන සූත්‍ර දේශනාව පැවැත්වීම යන තොරතුරු පහළොස්වන අධ්‍යාය දක්වා විස්තර කෙරේ.

දහසය වැන්නේ සිට තුන්බෑ ජටිලයන් සහ පිරිවර සමඟ පැමිණ පැවිදි වීම, බුදුරදුන් ගන්ධමාදන අඹරුක මුල පෙළහැර පෑම, පරිනිර්වාණය, ආදාහනය, ශේෂ වූ ධාතු කොටස්වලට පුද පූජා පැවැත්වීම. ද්‍රෝණ බමුණ විසින් ධාතු බෙදීම යන බුද්ධ චරිතය ආශ්‍රිත කරුණු රැසක් විසිවන පරිච්ඡේදයේ අවසානය දක්වා විස්තරාත්මකව ඉදිරිපත් කරයි. ථෙරවාද සංගායනාත්‍රය හා අශෝක රජු විසින් ධර්මදූතයන් පිටත්කර යැවීම, මහින්දාගමනය හා ලක්දිව බුදුදහම පිහිටුවීම මෙන්ම, බුද්ධඝෝෂ හිමියන් අටුවා සම්පාදනය ආදි ශාසන ඉතිහාසය සම්බන්ධ වැදගත් ඓතිහාසික තොරතුරු රැසක් ඉතිරි අධ්‍යාය පහෙන් ප්‍රකාශ කෙරේ. මෙහි මුළු අධ්‍යාය ප්‍රමාණය විසි පහකි. පාලි භාෂා ඌරුවට යමින් රචනා කර ඇති සද්ධර්මමකරන්දය ලංකාවේ සංස්කෘත සාහිත්‍ය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්මාණයකි.

මෙයින් පසුව විසි වන සියවසේ මැද භාගයේ හා අවසාන භාගයේ පහළ වූ ගිහිපැවිදි පඬිවරු විශාල වශයෙන් සංස්කෘත සාහිත්‍යයේ පෝෂණය සඳහා නිර්මාණ කටයුතුවල නිරතවූහ. විශේෂයෙන් විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් ආශ්‍රිතව පහළ වූ විදුරපොල පියතිස්ස, බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය, දවුල්දෙන ඥානිස්සර, කැකුලවෙල පියරතන ආදි පැවිදි පඬිවරු මෙන් ම ආරියදාස කුමාරසිංහ වැනි ගිහි පඬිවරු ද ඒ අතර වෙති. ඔවුන් අතින් බිහි වූ නිර්මාණ අතර, කැපී පෙනෙන නිර්මාණ කීපයක් වේ. දවුල්දෙන හිමියන්ගේ යතිදූතම් කාව්‍යය, කැකුලවෙල පියරතන හිමියන්ගේ පද්‍යචින්තාමණී මහා කාව්‍යය හා කෝට්ටේ යුගයේ පහළ වූ තොටගමුවේ රාහුල හිමියන්ගේ කාව්‍යශේඛරය සංස්කෘතයට නගමින් ආරියදාස කුමාරසිංහ විසින් කළ මහා කාව්‍ය අත් පිටපත ද කැපී පෙනෙන නිර්මාණ වශයෙන් දැක්විය හැකි ය.

මෙයට අමතරව විවිධ කවියන් උගතුන් විසින් භාරතයේ පහළ වූ සම්භාව්‍ය සංස්කෘත ග්‍රන්ථවලට කරන ලද සංස්කරණ හා භාව සන්න ද ව්‍යාකරණ ග්‍රන්ථයනට කළ සංස්කරණ ආදි ග්‍රන්ථ බොහෝමයක් විසිවන සියවසේ රචනා වී ඇත. ප්‍රාචීන භාෂෝපකාර සමාගම ද සංස්කෘත භාෂාශාස්ත්‍ර සංවර්ධනයෙහි සුවිශාල මෙහෙයක් ඉටු කළ ආයතනයක් වශයෙන් විසි වන සියවසේ ලංකා සංස්කෘත සාහිත්‍ය ඉතිහාසයට එක් වේ.

**ආන්තික සටහන්**

1 *රාමායණම්* v.x.18

2 - එම - v.xviii.2

3 *මහාවංසය* vii.4

4 එම x. 20

5 එම x. 79

6 එම x. 75

7 එම x. 29

8 එම xi. 21

9 එම x. 36-37

10 එම x. 98-102

11 *අනුරපුර යුගය*, 207 පිට.

12 *විචාරාභාස*, 346 පිට.

13 *නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය*, 21 පිට.

14 එම.

15 *අනුරපුර යුගය*, 207 පිට.

16 *ලක්දිව මහායාන අදහස්*, 40 පිට.

17 *පපඤ්චසූදනී*, vol.I. pp 201.

18 *සීගිරි පද්‍ය* (1 භාගය) 122, 146.

19 Paranavithana, *The subject of the Sigiri paintings India Antigna Leiden*. P 176

20 Paranavithana, *Sigiri Grafitti*. Vol. II. p 134

21 *සියබස්ලකර*, 3 පද්‍ය.

22 *කාව්‍යාදර්ශය*, 1. 2 පද්‍ය.

23 *ධම්පියා අටුවා ගැටපදය*, 3 පිට.

24 - එම - 136 පිට.

25 - එම - 21 පිට.

26 - එම - 63 පිට.

27 - එම - 104 පිට.

28 *E.Z.* Vol. III. Pp 199-212

29 *ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය*, 118 පිට.

30 *E.Z.* Vol. V. Pp 242 – 246

31 *Ceylon Sessional Papers*

32 - do -

33 *නිකායසංග්‍රහය හෙවත් ශාසනාවතාරය*, 18 පිට.

34 *මහාවංසය*, xxxvi. 41

35 - එම - xxxvi. 111-113

36 *රාජරත්නාකරය*, 67 පිට.

37 *මහාවංසය*, xxxvii. 39-40

38 *E.Z.* Vol. IV. Pp 151-161

39 - do -

40 *E.Z.* Vol. V. Pp 242-246

41 *E.Z.* Vol. I. Pp 4-5

42 *E.Z.* Vol. III. Pp 199-212

43 *E.Z.* Vol. V. Pp 162

44 *E.Z.* Vol. II. Pp 235

45 *E.Z.* Vol. V. Pp 174-176

46 *E.Z.* Vol. I. Pp 39-40

47 *බාලරාමායණම්*, රාජශේඛර. x. 10 පිට.

48 *අනුරාධපුර යුගයේ විශ්ව කීර්තිමත් සිංහල ලේඛකයෝ*, 16-17 පිටු.

49 *Sanskrit Literature*, Pp 105

50 - do - Pp 106 -107

51 *පියවර*, 13 කලාපය, 1-12 පිටු.

52 *අනුරාධපුර යුගයේ විශ්ව කීර්තිමත් සිංහල ලේඛකයෝ*, 64 පිට.

53 *ජානකීහරණය*, xx. 64

54 *Sanskrit Literature*. Pp 109

55 *ජානකීහරණය* (ගොඩකුඹුරේ හා පරණවිතාන සංස්කරණය)

56 *චූලවංසය*, xxxvii. 146 පද්‍ය

57 *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය*, පළමු භාගය.

58 *සිංහල සාහිත්‍ය වංශය*, 662-663 පිටු.

59 *වෛද්‍යක සාරාර්ථ සංග්‍රහය*, 1281-1282 පිටු.

60 *මංජුශ්‍රීභාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රය*, ප්‍රස්තාවනාව.

61 *මංජුශ්‍රීභාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රය*, ප්‍රස්තාවනාව ix-xvi පිටු.

62 *නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතරණය*, 37 පිට.

63 *ශාස්ත්‍රීය ලිපි හා කථා*. 325 පිට.

64 *අනුරපුර නටඹුන්*, iii පිට.

65 *චතුඃශතක*.

66 *ශාස්ත්‍රීය ලිපි හා කථා*.

67 *නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතරණය*, 37 පිට.

68 *E. Z.* Vol. II. Pp 252-253

69 *E. Z.* Vol. IV. Pp 203-206

70 *E. Z.* Vol. I. Pp 76-78

71 *E. Z.* Vol. II. Pp 87-88

72 - do - Pp 128-129

73 - do - Pp 158-160

74 - do - Pp 168-171

75 - do - Pp 222-224

76 *Sanskrit Literature,* Pp 72

77 - do - Pp 86-87

78 - do - Pp 152

79 *ලංකාවේ අධ්‍යාපනය,* 185 පිට.

80 *Sanskrit Literature*, Pp 166

81 - do - Pp 171

82 - do - Pp 174

83 *කතිකාවත් සඟරාව,* 1-5 පිටු.

84 *මහාබෝධිවංශ ගැටපදය,* 33 පිට.

85 *මහාබෝධිවංශ ගැටපදය,* 36 පිට.

86 - එම - 54 පිට.

87 - එම - 135 පිට.

88 - එම - 12 පිට.

89 *ලංකාවේ අධ්‍යාපනය,* 44 පිට.

90 *විශුද්ධිමාර්ග සන්නය,* 25 පිට.

91 *Sanskrit Literature,* Pp 204

92 *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය,* 557 පිට.

93 *සිංහල බෝධිවංශය,* 250 පිට.

94 *සංස්කෘත සාහිත්‍ය* 143 පිට.

95 *සරණංකර සඞ්ඝරාජ සමය,* 226 පිට.